

වාර්ෂික කාර්ය සාධන වාර්තාව

2022

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

පේරාදෙණිය

ශ්‍රී ලංකා

ශ්‍රී ලංකාවේ පේරාදෙණිය
කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින්
ප්‍රකාශයට පත් කරන ලදී
2023

මෙම වාර්තාව ශ්‍රී ලංකාවේ පේරාදෙණිය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, ප්‍රගති මෙහෙයුම් හා ඇගයීම් ඒකකය විසින් සම්පාදනය කොට කෘෂිකර්ම ප්‍රකාශන ඒකකය මගින් මුද්‍රණය කරන ලදී.

සියලුම හිමිකම් ඇවිරිණි. විවේචනය හා පුනරීක්ෂණය සඳහා කෙටි වාක්‍ය ඛණ්ඩවල උපුටා ගැනීම් හැරුණුවිට, මෙම ප්‍රකාශනයේ කිසිදු කොටසක් කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ පූර්ව අනුමැතියෙන් තොරව, නැවත ඉදිරිපත් කිරීම, පුනරුත්ථාපනය කළ හැකි වන සේ ගබඩා කර තැබීම, විද්‍යුත්, යාන්ත්‍රික, ඡායාස්ථිත, පටිගත කිරීම හෝ වෙනත් ක්‍රම උපයෝගී කරගනිමින් සම්ප්‍රේෂණය කිරීම සපුරා තහනම් වේ. අසාධාරණයක් නොවන පරිදි වාණිජ නොවන ස්වරූපයේ කටයුතු සඳහා මෙම අවසරය ලබාදීමට කටයුතු කරනු ලැබේ. ශ්‍රී ලංකාවේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් පළ කරනු ලබන ප්‍රකාශන වල, වාණිජ නොවන, කාර්යයන් සඳහා ප්‍රයෝජනයට ගැනීමේදී ගාස්තු ගෙවීම අනවශ්‍යවේ. කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන කටයුතුවලදී කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පර්යේෂණාත්මක සොයාගැනීම් සඳහා අව්‍යාජව යොදා ගැනීමට මෙම හිමිකම් ඇවිරීමේ ප්‍රකාශය බාධාවක් නොවනු ඇතැයි අපේක්ෂා කෙරේ.

2022 වර්ෂය සඳහා වාර්ෂික කාර්ය සාධන වාර්තාව

ආයතනයේ නම : කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

වැය ශීර්ෂ අංකය : 285

අන්තර්ගතය

පරිච්ඡේදය 01 - ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය 1
පරිච්ඡේදය 02 - ප්‍රගතිය හා ඉදිරි දැක්ම 13
පරිච්ඡේදය 03 - 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය 29
පරිච්ඡේදය 04 - කාර්ය සාධන දර්ශක 36
පරිච්ඡේදය 05 - තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරාගැනීමේ කාර්ය සාධනය 47
පරිච්ඡේදය 06 - මානව සම්පත් පැතිකඩ 48
පරිච්ඡේදය 07 - අනුකූලතා වාර්තාව 50
ඇමුණුම් 59

පරිච්ඡේදය 01 - ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1. හැඳින්වීම

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන අතර මනා දැනුමැති කෘෂිකාර්මික විශේෂඥයින් පිරිසක් සහ තාක්ෂණික කාර්ය මණ්ඩලයක් සහිත දිවයින පුරා ආවරණය වන ආයතන ජාලයක් සහිත විශාලතම රජයේ දෙපාර්තමේන්තුවකි.

ගොවියාගේ ආදායම හා ජීවන තත්ත්වය ඉහළ නැංවීම සහ සුරක්ෂිත කෘෂිකාර්මික නිෂ්පාදන දැරිය හැකි මිලකට ලබාදීම සඳහා හරිත කෘෂිකර්ම ප්‍රතිපත්තිය සමඟ ආහාර බෝග අංශයේ ඵලදායීතාව සහ නිෂ්පාදනය තිරසාර ලෙස ඉහළ නැංවීම කෙරෙහි කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අභිප්‍රායන් යොමුගත වී ඇත.

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව ක්‍රියාත්මක වන ප්‍රධාන ක්ෂේත්‍රයන් ලෙස පර්යේෂණ, ව්‍යාප්ති කටයුතු, කෘෂි අධ්‍යාපනය, බීජ හා රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය සහ බීජ, පැළෑටි නිරෝධායනය, පාංශු සංරක්ෂණය හා පළිබෝධනාශක හා සබැඳි නියාමන සේවා කටයුතු දැක්විය හැක. ශ්‍රී ලංකාවේ කෘෂි ක්ෂේත්‍රයේ නියාමන කටයුතු සිදුකරනු ලබන ප්‍රධාන පාර්ශවකරු වන්නේද මෙම දෙපාර්තමේන්තුවයි.

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කළමනාකරණ ව්‍යුහය වී පර්යේෂණ හා සංවර්ධන ආයතනය, ක්ෂේත්‍ර බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය, උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය, පලතුරු පර්යේෂණ හා සංවර්ධන ආයතනය යන බෝග පර්යේෂණ ආයතන හතරකින්ද, බීජ සහතික කිරීමේ හා පැළෑටි සංරක්ෂණ මධ්‍යස්ථානය, බීජ හා රෝපණ ද්‍රව්‍ය සංවර්ධන මධ්‍යස්ථානය, ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානය, ජාතික කෘෂිකර්ම තොරතුරු හා සන්නිවේදන මධ්‍යස්ථානය, සමාජ ආර්ථික සහ සැලසුම් මධ්‍යස්ථානය, ස්වභාවික සම්පත් කළමණාකරණ මධ්‍යස්ථානය යන තාක්ෂණික සේවා මධ්‍යස්ථාන හයකින්ද, ඉංජිනේරු අංශය, මුදල් අංශය, පරිපාලන අංශය, ප්‍රගති මෙහෙයුම් හා ඇගයීම් ඒකකය යන සහායක සේවා සපයන අංශ හතරකින්ද සමන්විත වේ.

1.2. ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

ඉදිරි දැක්ම

ජාතික සෞභාග්‍ය උදෙසා කෘෂිකාර්මික විශිෂ්ඨත්වය සාක්ෂාත් කර ගැනීම.

මෙහෙවර

නව දියුණු කෘෂිකාර්මික තාක්ෂණය ජනනය කර ව්‍යාප්ත කිරීම සහ අදාල සේවාවන් ගොවීන් වෙත වැඩි අවධාරණයක් සහිතව සියළුම පාර්ශවකරුවන් වෙත ලබාදීමෙන් ජාතියේ ආහාර සහ පෝෂණ සුරක්ෂිතතාව තහවුරු කිරීම සඳහා යෝග්‍ය සහ තිරසාර කෘෂිකාර්මික සංවර්ධනයක් අත්පත්කර ගැනීම.

අරමුණු

- ආහාර බෝග වගාවේ නිෂ්පාදන විභවයන් වැඩිදියුණු කිරීම.
- තිරසාර සහ පරිසර හිතකාමී ගොවිතැන තහවුරු කිරීම.
- ශ්‍රම සහ ඉඩම් කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම.
- කෘෂිකර්මාන්තයේ නියැලි සියළු පාර්ශව බලගැන්වීම.
- කෘෂිකර්මාන්තය තුල මානව සම්පතෙහි හැකියා වර්ධනය.

- පාර්ශවකරුවන් සඳහා ගුණාත්මක තත්ත්වයේ බීජ සහ රෝපණ ද්‍රව්‍යවල සුලභතාවය සහතික කරලීම.
- බීජ සහ රෝපණ ද්‍රව්‍ය මෙන්ම කෘෂි නිෂ්පාදනවල ගුණාත්මක ප්‍රමිතීන් සුරක්ෂිත කරලීම.
- ඉඩම් සහ ජල සම්පත ප්‍රශස්ත මට්ටමෙන් භාවිත කිරීම.
- සැලසුම්, ප්‍රතිපත්ති තීරණ සහ ප්‍රතිපත්ති විධාන සඳහා පහසුකම් සැලසීම.
- දේශීය ශාක හානිකර විදේශීය විශේෂවලින් ආරක්ෂා කිරීමට කටයුතු කිරීම.
- කෘෂි නිෂ්පාදන තුලින් විදේශ විනිමය වැඩිකිරීම සඳහා නීරෝගී ශාක සහ ශාක නිෂ්පාදන අපනයනය සඳහා පහසුකම් සැපයීම.
- පළිබෝධනාශකවල අයහපත් බලපෑම්වලින් මහජනයා සහ පරිසරය ආරක්ෂා කිරීමට කටයුතු කිරීම.
- පැළෑටි ජාන සම්පත් තිරසාර ලෙස භාවිතයට ගැනීම පිළිබඳ සහතිකවීම.

1.3. ප්‍රධාන කාර්යයන්

- එළවළු, පළතුරු, වී හා අතිරේක ආහාර බෝගවල නිෂ්පාදන විභවයන් වැඩිදියුණු කිරීම අරමුණු කර ගනිමින් කෘෂිකාර්මික පර්යේෂණ මඟින් උචිත නව ප්‍රභේද හා කෘෂි තාක්ෂණයන් ජනනය කිරීම.
- විවිධ කෘෂි ව්‍යාප්ති ක්‍රමවේදයන් භාවිතා කරමින් දියුණු කෘෂි තාක්ෂණයන් ගොවි ප්‍රජාවට හඳුන්වා දීම හා ව්‍යාප්ත කිරීම.
- එළවළු, පළතුරු, වී හා අතිරේක ආහාර බෝග ඇතුළු ආහාර බෝගවල බීජ සහ රෝපණ ද්‍රව්‍ය සම්මත ක්‍රමවේද භාවිතා කරමින් නිෂ්පාදනය කිරීම, සහතිකකරණය හා බෙදා හැරීම මගින් පාර්ශවකරුවන් සඳහා ගුණාත්මක තත්ත්වයේ බීජවල සුලභතාවය සහතික කරලීම.
- තිරසාර ලෙස භාවිතයට ගැනීම පිළිබඳ සහතිකවීම සඳහා පැළෑටි ජාන සම්පත් සංරක්ෂණය කිරීම.
- නිෂ්පාදන ඵලදායිතාවය ඉහළ නැංවීම සඳහා ඉඩම් සහ ජල සම්පත ප්‍රශස්ත මට්ටමෙන් භාවිතය තහවුරු කිරීම.
- දේශීය ශාක හානිකර විදේශීය විශේෂවලින් ආරක්ෂා කිරීමට කටයුතු කිරීම.
- කෘෂි නිෂ්පාදන තුලින් විදේශ විනිමය වැඩිකිරීම සඳහා නීරෝගී ශාක සහ ශාක නිෂ්පාදන අපනයනය සඳහා පහසුකම් සැපයීම.
- පළිබෝධනාශකවල අයහපත් බලපෑම්වලින් මහජනයා සහ පරිසරය ආරක්ෂා කිරීමට කටයුතු කිරීම.
- පාංශු සංරක්ෂණ පනත, පැළෑටි සංරක්ෂණ පනත, ගස් හෙළීම පාලන පනත, පළිබෝධ නාශක පාලන පනත සහ බීජ පනත ක්‍රියාත්මක කිරීම.
- තිරසාර සහ පරිසර හිතකාමී කෘෂිකර්මය තහවුරු කිරීම සඳහා කටයුතු කිරීම.
- කෘෂි අධ්‍යාපනය තුලින් කෘෂිකාර්මික අංශයට සේවාවන් සැපයීමට අවශ්‍ය තෘතීයික නිපුණතාවයෙන් යුතු මධ්‍යම කළමනාකරණ මට්ටමේ මානව සම්පත බිහි කිරීම සඳහා කෘෂිකර්මය පිළිබඳ ජාතික වෘත්තීය පුහුණු (NVQ) 5 හා 6 මට්ටමේ ඩිප්ලෝමා පාඨමාලා පවත්වා ගෙන යාම, ගොවීන් සහ නිලධාරීන්ගේ හැකියා වර්ධනයට අවශ්‍ය පුහුණු වැඩසටහන් පැවැත්වීම.

1.4. සංවිධාන සටහන



වී. පර්. හා සං.	- වී පර්යේෂණ හා සංවර්ධන ආයතනය
ක්ෂේ. බෝ. පර්. හා සං.	- ක්ෂේත්‍ර බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය
උ. බෝ. පර්. හා සං.	- උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය
පල. පර්. හා සං.	- පලතුරු පර්යේෂණ හා සංවර්ධන ආයතනය
ස්ව. ස. කළ.	- ස්වභාවික සම්පත් කළමණාකරණ මධ්‍යස්ථානය
ස. ආර්. හා සැල.	- සමාජ ආර්ථික හා සැලසුම් මධ්‍යස්ථානය
බී. ස. හා පැ. සං.	- බීජ සහතික කිරීමේ හා පැළැටි සංරක්ෂණ මධ්‍යස්ථානය
බී. හා රෝ. ද්‍ර. සං.	- බීජ හා රෝපණ ද්‍රව්‍ය සංවර්ධන මධ්‍යස්ථානය
ව්‍යාප්ති හා පුහුණු	- ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානය
කෘ. තො. හා ස.	- ජාතික කෘෂිකර්ම තොරතුරු හා සන්නිවේදන මධ්‍යස්ථානය
ප්‍ර, මෙ.හා ඇ.	- ප්‍රගති මෙහෙයුම් හා ඇගයීම් ඒකකය

1.5. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ:

1.5.1 කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් කාර්යාලය
1.5.2 අතිරේක කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් (පර්යේෂණ) කාර්යාලය - පේරාදෙණිය
1.5.3 අතිරේක කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් (සංවර්ධන) කාර්යාලය - පේරාදෙණිය
1.5.4 අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන) කාර්යාලය - පේරාදෙණිය
1.5.5 ප්‍රධාන මූල්‍ය නිලධාරී කාර්යාලය - පේරාදෙණිය

1.5.6 වී පර්යේෂණ හා සංවර්ධන ආයතනය - බතලගොඩ
  1.5.6.1 ප්‍රාදේශීය වී පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය - බෝඹුවල
  1.5.6.2 වී පර්යේෂණ ස්ථානය - අම්බලන්තොට
  1.5.6.3 වී පර්යේෂණ ස්ථානය - බෙන්තොට
  1.5.6.4 වී පර්යේෂණ ස්ථානය - ලබුදුව
  1.5.6.5 වී පර්යේෂණ ස්ථානය - සමන්තුරේ
  1.5.6.6 වී පර්යේෂණ ස්ථානය - පරන්තන්
  1.5.6.7 වී පර්යේෂණ ස්ථානය - මුරුන්කන්

1.5.7 ක්ෂේත්‍ර බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය - මහඉලුප්පල්ලම
  1.5.7.1. තෙල් හා මාෂ බෝග පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය - අඟුණකොළපැලැස්ස
  1.5.7.2 ප්‍රාදේශීය කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය - අරලගංවිල
  1.5.7.3 ප්‍රාදේශීය කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය - කිලිනොච්චි
  1.5.7.4 ප්‍රාදේශීය කෘෂිකර්ම පර්යේෂණ මධ්‍යස්ථානය - කරදියන්ආරු
  1.5.7.5 කෘෂිකර්ම පර්යේෂණ ස්ථානය - වවුනියා
  1.5.7.6 කෘෂිකර්ම පර්යේෂණ ස්ථානය - තිරුනෙල්වේලි
  1.5.7.7 කෘෂිකර්ම පර්යේෂණ ස්ථානය - තෙලිජ්ජවිල
  1.5.7.8 කෘෂිකර්ම පර්යේෂණ ස්ථානය - වීරවිල
  1.5.7.9 ගොවිපළ යාන්ත්‍රීකරණ පර්යේෂණ මධ්‍යස්ථානය - මහඉලුප්පල්ලම

1.5.8 උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය - ගන්නෝරුව
  1.5.8.1 ප්‍රාදේශීය කෘෂිකර්ම පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය - බණ්ඩාරවෙල
  1.5.8.2 කෘෂිකර්ම පර්යේෂණ ස්ථානය - සීතාඑළිය
  1.5.8.3 කෘෂිකර්ම පර්යේෂණ ස්ථානය - ගිරාඳුරුකෝට්ටේ
  1.5.8.4 ආහාර පර්යේෂණ ඒකකය - ගන්නෝරුව
  1.5.8.5 උද්‍යාන බෝග පර්යේෂණ ස්ථානය - කල්පිටිය
  1.5.8.6 උද්‍යාන බෝග පර්යේෂණ ගොවිපල - ගන්නොරුව
  1.5.8.7 උපයෝගිතා පර්යේෂණ ඒකකය - වාගොල්ල
  1.5.8.8 උපයෝගිතා පර්යේෂණ ඒකකය - තිබ්බටුමුල්ල
  1.5.8.9 උපයෝගිතා පර්යේෂණ ඒකකය - වාරියපොළ

1.5.8.10 උපයෝගිතා පර්යේෂණ ඒකකය - තඹබෝව

1.5.9 පලතුරු පර්යේෂණ හා සංවර්ධන ආයතනය - හොරණ

1.5.9.1 තිරසාර කෘෂිකර්ම පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය - මාකඳුර

1.5.9.2 පලතුරු බෝග පර්යේෂණ හා සංවර්ධන ස්ථානය - ගන්නෝරුව

1.5.9.3 පැළෑටි වෛරස් හඳුනාගැනීමේ මධ්‍යස්ථානය - හෝමාගම

1.5.9.4 කෘෂිකර්ම පර්යේෂණ ස්ථානය - මදුරුකැටිය

1.5.9.5 කෘෂිකර්ම පර්යේෂණ ස්ථානය - මුතුකණ්ඩිය

1.5.9.6 කෘෂිකර්ම පර්යේෂණ ස්ථානය - රහංගල

1.5.9.7 පළතුරු බෝග පර්යේෂණ ගොවිපල - එරමිණිගොල්ල

1.5.9.8 දොඩම් පර්යේෂණ ඒකකය - බිබිල

1.5.9.9 ජාතික පළතුරු ප්‍රභේද සංරක්ෂණ මධ්‍යස්ථානය - කුණ්ඩසාලේ

1.5.10 ස්වභාවික සම්පත් කළමනාකරණ මධ්‍යස්ථානය - පේරාදෙණිය

1.5.10.1 පාංශු සංරක්ෂණ දැනුම් කළමනාකරණ මධ්‍යස්ථානය - කුණ්ඩසාලේ

1.5.10.2 ස්වාභාවික සම්පත් කළමනාකරණ හා පාංශු සංරක්ෂණ ආදර්ශ කේන්ද්‍රය - කුණ්ඩසාලේ

1.5.11 සමාජ ආර්ථික හා සැලසුම් මධ්‍යස්ථානය - පේරාදෙණිය

1.5.12 ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානය - පේරාදෙණිය

1.5.12.1 සේවා සංස්කරණ අභ්‍යාස ආයතනය - අහුණකොළපැලැස්ස

1.5.12.2 සේවා සංස්කරණ අභ්‍යාස ආයතනය - ගන්නෝරුව

1.5.12.3 සේවා සංස්කරණ අභ්‍යාස ආයතනය - හංසයාපාලම

1.5.12.4 ගොවිපල් යාන්ත්‍රික අභ්‍යාස මධ්‍යස්ථානය - අනුරාධපුර

1.5.12.5 දිස්ත්‍රික් ගොවි පුහුණු මධ්‍යස්ථානය - අඩ්ඩාලචේන

1.5.12.6 දිස්ත්‍රික් ගොවි පුහුණු මධ්‍යස්ථානය - වාවින්න

1.5.12.7 දිස්ත්‍රික් ගොවි පුහුණු මධ්‍යස්ථානය - පොළොන්නරුව

1.5.12.8 දිස්ත්‍රික් ගොවි පුහුණු මධ්‍යස්ථානය - වීරවිල

1.5.12.9 ශ්‍රී ලංකා කෘෂිකර්ම විද්‍යාලය - අහුණකොළපැලැස්ස

1.5.12.10 ශ්‍රී ලංකා කෘෂිකර්ම විද්‍යාලය - කරපිංච

1.5.12.11 ශ්‍රී ලංකා කෘෂිකර්ම විද්‍යාලය - කුණ්ඩසාලේ

1.5.12.12 ශ්‍රී ලංකා කෘෂිකර්ම විද්‍යාලය - පැල්වෙහෙර

1.5.11.13 ශ්‍රී ලංකා කෘෂිකර්ම විද්‍යාලය - වවුනියා

1.5.11.14 ශ්‍රී ලංකා කෘෂිකර්ම විද්‍යාලය - අනුරාධපුර

1.5.12.15 ශ්‍රී ලංකා කෘෂිකර්ම විද්‍යාලය - ලබුදුව

1.5.12.16 ශ්‍රී ලංකා කෘෂිකර්ම විද්‍යාලය - පාලමුණේ

1.5.12.17 ශ්‍රී ලංකා කෘෂිකර්ම විද්‍යාලය - පරන්තන්

1.5.12.18 ශ්‍රී ලංකා කෘෂිකර්ම විද්‍යාලය - වාරියපොළ
1.5.12.19 ශ්‍රී ලංකා කෘෂිකර්ම විද්‍යාලය - බිබිල
1.5.12.20 නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (අන්තර් පළාත්) කාර්යාලය - අම්පාර
1.5.12.21 නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (අන්තර් පළාත්)කාර්යාලය - අනුරාධපුර
1.5.12.22 නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (අන්තර් පළාත්)කාර්යාලය - හම්බන්තොට
1.5.12.23 නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (අන්තර් පළාත්)කාර්යාලය - හසලක
1.5.12.24 නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (අන්තර් පළාත්)කාර්යාලය - මොණරාගල
1.5.12.25 නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (අන්තර් පළාත්)කාර්යාලය - පොළොන්නරුව
1.5.12.26 මී මැසි සංවර්ධන ඒකකය - බිඳුණුවැව, බණ්ඩාරවෙල
1.5.12.27 තරුණ ගොවි සමාජ මූලස්ථානය - පේරාදෙණිය
1.5.12.28 කෘෂි ව්‍යාපාර සංවර්ධන අංශය - ගන්නොරුව
1.5.12.29 ආර්ථික මධ්‍යස්ථානය - දඹුල්ල

1.5.13 ජාතික කෘෂිකර්ම තොරතුරු හා සන්නිවේදන මධ්‍යස්ථානය - ගන්නෝරුව
1.5.13.1 කෘෂිකර්ම ප්‍රකාශන ඒකකය - ගන්නෝරුව
1.5.13.2 කෘෂි ගුවන්විදුලි සේවාව - කොළඹ
1.5.13.3 කෘෂි ගුවන්විදුලි සේවාව - මහනුවර
1.5.13.4 කෘෂි ගුවන්විදුලි සේවාව - අනුරාධපුර
1.5.13.5 කෘෂි ගුවන්විදුලි සේවාව - මාතර
1.5.13.6 කෘෂි ගුවන්විදුලි සේවාව - තිරුනෙල්වේලි
1.5.13.7 කෘෂි තාක්ෂණ උද්‍යානය - ගන්නෝරුව
1.5.13.8 කෘෂි තාක්ෂණ උද්‍යානය - බටඅත
1.5.13.9 මධ්‍යම කෘෂිකර්ම පුස්තකාලය - ගන්නෝරුව
1.5.13.10 පරිසර හිතකාමී කෘෂි ඒකකය - දියගම

1.5.14 බීජ හා රෝපණ ද්‍රව්‍ය සංවර්ධන මධ්‍යස්ථානය - පේරාදෙණිය
1.5.14.1 නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (බී. රෝ. ද්‍ර.) කාර්යාලය - අලුත්තරම
1.5.14.2 නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (බී. රෝ. ද්‍ර.) කාර්යාලය - අම්පාර
1.5.14.3 නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (බී. රෝ. ද්‍ර.) කාර්යාලය - බටඅත
1.5.14.4 නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (බී. රෝ. ද්‍ර.) කාර්යාලය - නාරාහේන්පිට
1.5.14.5 නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (බී. රෝ. ද්‍ර.) කාර්යාලය - කන්තලේ
1.5.14.6 නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (බී. රෝ. ද්‍ර.) කාර්යාලය - කිලිනොච්චි
1.5.14.7 නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (බී. රෝ. ද්‍ර.) කාර්යාලය - කුණ්ඩසාලේ
1.5.14.8 නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (බී. රෝ. ද්‍ර.) කාර්යාලය - මහඉලුප්පල්ලම
1.5.14.9 නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (බී. රෝ. ද්‍ර.) කාර්යාලය - නිකවැරටිය
1.5.14.10 නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (බී. රෝ. ද්‍ර.) කාර්යාලය - සීතාඑළිය
1.5.14.11 නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (බී. රෝ. ද්‍ර.) කාර්යාලය - පැල්වෙහෙර
1.5.14.12 නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (බී. රෝ. ද්‍ර.) කාර්යාලය - පොළොන්නරුව

1.5.14.13 නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (බී. රෝ. ද්‍ර.) කාර්යාලය - තෙලිජ්ජවිල
1.5.14.14 නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (බී. රෝ. ද්‍ර.) කාර්යාලය - වවුනියා
1.5.14.15 සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (බී. රෝ. ද්‍ර.) කාර්යාලය - කරදියන්ආරු
1.5.14.16 සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (බී. රෝ. ද්‍ර.) කාර්යාලය - මුරුන්කන්
1.5.14.17 සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (බී. රෝ. ද්‍ර.) කාර්යාලය - යාපනය
1.5.14.18 රජයේ බීජ ගොවිපල - අලුත්තරම
1.5.14.19 රජයේ බීජ ගොවිපල - අම්බලන්තොට
1.5.14.20 රජයේ බීජ ගොවිපල - අඹේපුස්ස
1.5.14.21 රජයේ බීජ ගොවිපල - මහඉලුප්පල්ලම
1.5.14.22 රජයේ බීජ ගොවිපල - කන්තලේ
1.5.14.23 රජයේ බීජ ගොවිපල - මිද්දෙණිය
1.5.14.24 රජයේ බීජ ගොවිපල - පොළොන්නරුව
1.5.14.25 රජයේ බීජ ගොවිපල - මල්වත්ත, අම්පාර
1.5.14.26 රජයේ බීජ ගොවිපල - මුරුන්කන්
1.5.14.27 රජයේ බීජ ගොවිපල - කරදියන්ආරු
1.5.14.28 රජයේ බීජ ගොවිපල - පරන්තන්
1.5.14.29 රජයේ බීජ ගොවිපල - කුණ්ඩසාලේ
1.5.14.30 රජයේ බීජ ගොවිපල - මීපිලිමාන
1.5.14.31 රජයේ බීජ ගොවිපල - රහංගල
1.5.14.32 රජයේ බීජ ගොවිපල - උඩරදැල්ල
1.5.14.33 රජයේ බීජ ගොවිපල - සීතාඑළිය
1.5.14.34 රජයේ බීජ ගොවිපල - බටඅත
1.5.14.35 රජයේ බීජ ගොවිපල - කඳපොල
1.5.14.36 රජයේ බීජ ගොවිපල - පිදුරුතලාගල
1.5.14.37 රජයේ බීජ ගොවිපල - වල්පිට
1.5.14.38 රජයේ බීජ ගොවිපල - උල්පතගම
1.5.14.39 රජයේ බීජ ගොවිපල - බණ්ඩාරගම
1.5.14.40 රජයේ බීජ ගොවිපල - තෙලිජ්ජවිල
1.5.14.41 රජයේ බීජ ගොවිපල - පැල්වෙහෙර
1.5.14.42 රජයේ බීජ ගොවිපල - ඉහිණිමිටිය
1.5.14.43 රජයේ බීජ ගොවිපල - වීරපාන
1.5.14.44 රජයේ බීජ ගොවිපල - එළුවන්කුලම
1.5.14.45 පළතුරු බෝග පර්යේෂණ ගොවිපල - අඹතැන්න
1.5.14.46 කෘෂි බීජ අලෙවි සැල - කොළඹ 07
1.5.14.47 එළවළු බීජ මධ්‍යස්ථානය - ගන්නෝරුව
1.5.14.48 බීජ බෝංචි ඒකකය - රිකිල්ලගස්කඩ
1.5.14.49 කෘෂි බීජ අලෙවි සැල - මාතර
1.5.14.50 කෘෂි බීජ අලෙවි සැල - මහඉලුප්පල්ලම

1.5.14.51 කෘෂි බීජ අලෙවි සැල - බතලගොඩ
1.5.14.52 කෘෂි බීජ අලෙවි සැල - වාගොල්ල
1.5.14.53 කෘෂි බීජ අලෙවි සැල - මදුරුකැටිය
1.5.14.54 කෘෂි බීජ අලෙවි සැල - බණ්ඩාරවෙල
1.5.14.55 කෘෂි බීජ අලෙවි සැල - පරන්තන්
1.5.14.56 කෘෂි බීජ අලෙවි සැල - පොලොන්නරුව
1.5.14.57 කෘෂි බීජ අලෙවි සැල - අළුත්තරම
1.5.14.58 කෘෂි බීජ අලෙවි සැල - අම්බලන්තොට
1.5.14.59 කෘෂි බීජ අලෙවි සැල - කුණ්ඩසාලේ
1.5.14.60 කෘෂි බීජ අලෙවි සැල - නිකවැරටිය
1.5.14.61 කෘෂි බීජ අලෙවි සැල - බටඅත
1.5.14.62 කෘෂි බීජ අලෙවි සැල - ගන්නොරුව
1.5.14.63 බීජ අර්තාපල් ගබඩාව - සීතාඑළිය
1.5.14.64 බීජ හා රෝපණ ද්‍රව්‍ය අලෙවි සැල - අඹේපුස්ස
1.5.14.65 බීජ හා රෝපණ ද්‍රව්‍ය අලෙවි සැල - වල්පිට
1.5.14.66 බීජ හා රෝපණ ද්‍රව්‍ය අලෙවි සැල - නාරාහේන්පිට, කොළඹ 05
1.5.14.67 බීජ හා රෝපණ ද්‍රව්‍ය අලෙවි සැල - පස්යාල
1.5.14.68 බීජ හා රෝපණ ද්‍රව්‍ය අලෙවි සැල - බත්තරමුල්ල
1.5.14.69 බීජ හා රෝපණ ද්‍රව්‍ය අලෙවි සැල - අම්පාර
1.5.14.70 බීජ හා රෝපණ ද්‍රව්‍ය අලෙවි සැල - කරදියන්ආරු
1.5.14.71 බීජ හා රෝපණ ද්‍රව්‍ය අලෙවි සැල - ඉහිනිමිටිය
1.5.14.72 බීජ හා රෝපණ ද්‍රව්‍ය අලෙවි සැල - යටියන
1.5.14.73බීජ හා රෝපණ ද්‍රව්‍ය අලෙවි සැල - පැල්වෙහෙර
1.5.14.74 බීජ හා රෝපණ ද්‍රව්‍ය අලෙවි සැල - තෙලිජ්ජවිල
1.5.14.75 බීජ හා රෝපණ ද්‍රව්‍ය අලෙවි සැල - කල්තොට
1.5.14.76 බීජ හා රෝපණ ද්‍රව්‍ය අලෙවිසැල - වීරපාන
1.5.14.77 බීජ හා රෝපණ ද්‍රව්‍ය අලෙවි සැල - පුත්තලම
1.5.14.78 අතිරේක ආහාර බෝග බීජ ගබඩාව - රහංගල,බොරලන්ද
1.5.14.79 උද්‍යාන විද්‍යා පර්යේෂණ ගොවිපල - පස්යාල

1.5.15 බීජ සහතික කිරීමේ හා පැළෑටි සංරක්ෂණ මධ්‍යස්ථානය - ගන්නෝරුව
1.5.15.1 බීජ සහතික කිරීමේ සේවය - ගන්නෝරුව
1.5.15.1.1 බීජ සහතික කිරීමේ සේවය - අළුත්තරම
1.5.15.1.2. බීජ සහතික කිරීමේ සේවය - බටඅත
1.5.15.1.3 බීජ සහතික කිරීමේ සේවය - මහඉලුප්පල්ලම
1.5.15.1.4 බීජ සහතික කිරීමේ සේවය - නිකවැරටිය
1.5.15.1.5 බීජ සහතික කිරීමේ සේවය - පැල්වෙහෙර
1.5.15.1.6 බීජ සහතික කිරීමේ සේවය - පොලොන්නරුව

1.5.15.1.7 බිජ සහතික කිරීමේ සේවය - බිබිල

1.5.15.1.8 බිජ සහතික කිරීමේ සේවය - හිඟුරක්ගොඩ

1.5.15.1.9 බිජ සහතික කිරීමේ සේවය - කන්තලේ

1.5.15.1.10 බිජ සහතික කිරීමේ සේවය - කුණ්ඩසාලේ

1.5.15.1.11 බිජ සහතික කිරීමේ සේවය - සීතාඑලිය

1.5.15.1.12 බිජ සහතික කිරීමේ සේවය - අම්පාර

1.5.15.1.13 බිජ සහතික කිරීමේ සේවය - බතලගොඩ

1.5.15.1.14 බිජ සහතික කිරීමේ සේවය - මඩකලපුව

1.5.15.1.15 බිජ සහතික කිරීමේ සේවය - කොළඹ

1.5.15.1.16 බිජ සහතික කිරීමේ සේවය - ලබුදුව

1.5.15.1.17 බිජ සහතික කිරීමේ සේවය - මුරුන්කන්

1.5.15.1.18 බිජ සහතික කිරීමේ සේවය - පැල්මඩුල්ල

1.5.15.1.19 බිජ සහතික කිරීමේ සේවය - රිකිල්ලගස්කඩ

1.5.15.1.20 බිජ සහතික කිරීමේ සේවය - වවුනියාව

1.5.15.1.21 බිජ සහතික කිරීමේ සේවය - මාතර

1.5.15.1.22 බිජ සහතික කිරීමේ සේවය - මතුගම

1.5.15.1.23 බිජ සහතික කිරීමේ සේවය - යාපනය

1.5.15.1.24 බිජ සහතික කිරීමේ සේවය - පරන්තන්

1.5.15.1.25 බීජ පරීක්ෂණාගාරය - පේරාදෙණිය

1.5.15.1.26 බීජ පරීක්ෂණාගාරය - මහඉලුප්පල්ලම

1.5.15.1.27 බීජ පරීක්ෂණාගාරය - අළුත්තරම

1.5.15.1.28 බීජ පරීක්ෂණාගාරය - බටඅත

1.5.15.1.29 බීජ පරීක්ෂණාගාරය - පරන්තන්

1.5.15.1.30 පශ්චාත් පාලන ක්ෂේත්‍රය I - ගන්නෝරුව

1.5.15.1.31 පශ්චාත් පාලන ක්ෂේත්‍ර අංක II - ගන්නෝරුව

1.5.15.1.32 පශ්චාත් පාලන ක්ෂේත්‍රය - සිතාඑලිය

1.5.15.1.33 පශ්චාත් පාලන ක්ෂේත්‍රය - මහඉලුප්පල්ලම

1.5.15.1.34 පශ්චාත් පාලන ක්ෂේත්‍ර - කරදියන්ආරු

1.5.15.1.35 පශ්චාත් පාලන ක්ෂේත්‍රය හා බීජ කෞතුකාගාරය - බටඅත

1.5.15.1.36 බීජ සෞඛ්‍ය ඒකකය - ගන්නෝරුව

1.5.15.2 පැළෑටි සංරක්ෂණ සේවය - ගන්නෝරුව

1.5.15.2.1 පැලෑටි සංරක්ෂණ සේවය, මහඉලුප්පල්ලම

1.5.15.2.2 පැලෑටි සංරක්ෂණ සේවය, බෝඹුවල, කළුතර

1.5.15.3 පළිබෝධනාශක රෙජිස්ට්‍රාර් කාර්යාලය - පේරාදෙණිය

1.5.15.4 පැළෑටි ජාන සම්පත් මධ්‍යස්ථානය - ගන්නෝරුව

1.5.15.5 ජාතික පැළෑටි නිරෝධායන සේවය - කටුනායක

1.5.15.5.1 පැළෑටි නිරෝධායන ඒකකය - ගන්නෝරුව

1.5.15.5.2 පැළෑටි නිරෝධායන ඒකකය - ගුවන්තොටුපොල, කොළඹ

1.5.15.5.3 පැළෑටි නිරෝධායන ඒකකය - ගුවන්තොටුපොල, මත්තල

1.5.15.5.4 පැළෑටි නිරෝධායන ඒකකය - කොළඹ වරාය

1.5.15.5.5 පැළෑටි නිරෝධායන ඒකකය - හම්බන්තොට වරාය

1.5.15.5.6 පැළෑටි නිරෝධායන ඒකකය - ගුවන්තොටුපොල, යාපනය

1.5.16.5.7 පැළෑටි නිරෝධායන ඒකකය - මධ්‍යම තැපැල් හුවමාරුව

1.5.16 පරිපාලන අංශය - පේරාදෙණිය

1.5.17 ආයතන අංශය - පේරාදෙණිය

1.5.18 ඉංජිනේරු අංශය - පේරාදෙණිය

1.5.18.1 ප්‍රාදේශීය ඉංජිනේරු වැඩපල - කුණ්ඩසාලේ

1.5.18.2 ප්‍රාදේශීය ඉංජිනේරු වැඩපල - පොළොන්නරුව

1.5.18.3 ප්‍රාදේශීය ඉංජිනේරු වැඩපල - අහුණකොලපැලැස්ස

1.5.18.4 ප්‍රාදේශීය ඉංජිනේරු වැඩපල - සීතාඑළිය

1.5.19 මුදල් අංශය - පේරාදෙණිය

1.5.20 අභ්‍යන්තර විගණන අංශය - පේරාදෙණිය

1.5.21 ප්‍රගති මෙහෙයුම් හා ඇගයීම් ඒකකය - පේරාදෙණිය

1.6. දෙපාර්තමේන්තුව යටතේ පවතින ආයතන/ අරමුදල්: නැත

1.7. විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු :

ව්‍යාපෘතියේ නම	**දායක නියෝජිතායතනය**	**ඇස්තමේන්තු ගත පිරිවැය (රු. මිලියන)**	**කාලසීමාව**
01. ආසියාවේ වී අස්වනු පරතරය පියවීම	IRRI	2.47	2013 - 2022
02. AFACI සාමාජික රටවල් සඳහා සුදුසු ආතතියට ඔරොත්තු දෙන, ඉහළ අස්වැන්නක් ලබා දෙන වී ප්‍රභේද ජනක ප්ලාස්ම අගය එකතු කිරීම සඳහා උපයෝගී කර ගැනීම	AFACI	4.20	2022 - 2024

ව්‍යාපෘතියේ නම	**දායක නියෝජිතායතනය**	**ඇස්තමේන්තු ගත පිරිවැය (රු. මිලියන)**	**කාලසීමාව**
03. විවිධ පරිසරයන් යටතේ ආසන්න වියන් පරිසරයේ පැහැදිලිභාවය සහ වීවල තාප ප්‍රේරිත ශූකිකා වන්ධ්‍යතාව අධ්‍යයනය කිරීම	NIAES	0.46	2019 -2022
04. ආසියානු කලාපයේ සංක්‍රමණික කෘමි පළිබෝධ මර්දනය කිරීම සඳහා අන්තර් හුවමාරු ජාලයක් ස්ථාපනය කිරීම	AFACI	5.30	2019 -2022
05. ආසියාවේ එළවළු ප්‍රභේද සංවර්ධනය	AFACI	5.30	2021 - 2023
06. ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ උසස් තත්ත්වයේ ලොකු ළූණු නිෂ්පාදන ආදර්ශ ගම්මාන සංවර්ධනය	KOPIA	4.03	2021 - 2023
07. ශ්‍රී ලංකාවේ වාණිජ නිෂ්පාදනය සඳහා ජමනාරන් ආදර්ශ ගම්මානයක් සංවර්ධනය කිරීම	KOPIA	2.56	2021 - 2023
08. බිම්මල් ගොවීන්ගේ ආදායම වැඩි කිරීම සඳහා නිෂ්පාදන හා උපයෝගිතා තාක්ෂණ බිහි කිරීම	KOPIA	2.0	2017 - 2022
09. කෘෂිකාර්මික නිෂ්පාදන සැකසුම් තාක්ෂණය සංවර්ධනය කිරීම සහ ව්‍යාප්ත කිරීම	AFACI	1.156	2019 - 2023
10. පසු අස්වනු අත් පොත් සකස් කිරීම සහ භාවිතා කිරීම	AFACI	0.11	2017 - 2022
11. ශ්‍රී ලංකාවේ ආහාර බෝගවල කළු කියත් පණුවන් (*Helicoverpa* spp.) පාලනයේදී Nucleo polyhedron වෛරස්වල (NPV) කාර්යක්ෂමතාවය ලාක්ෂණිකරණය කිරීම	USDA	1.81	2020 - 2023
12. ජෛව පළිබෝධ නාශක ප්‍රවර්ධනය තුළින් ආසියා පළිබෝධනාශක ශේෂයන් අවම කිරීම	APAARI	0.87	2012 - 2023

ව්‍යාපෘතියේ නම	**දායක නියෝජිතායතනය**	**ඇස්තමේන්තුගත පිරිවැය (රු. මිලියන)**	**කාලසීමාව**
13. ශ්‍රී ලංකාවේ සුවිශේෂී පරිසර දූෂණ කලාප තුනක වායුගෝලීය නයිට්‍රජන් දූෂණ මූලාශ්‍ර තක්සේරු කිරීම, පාරිසරික තිරසාර භාවය කෙරෙහි හා මානව සෞඛ්‍ය කෙරෙහි ඇති කරන්නා වූ බලපෑම සඳහා පිළියම් ක්‍රියාමාර්ග සෙවීම	IAEA	0.867	2018 - 2023
14. ශ්‍රී ලංකාවේ ප්‍රකාශිත සංරක්ෂණ ප්‍රදේශවල කඳුකර කෘෂිකාර්මික ජල පෝෂකවල කෘෂි දූෂක ප්‍රභවයන් හා ප්‍රවාහනය හඳුනා ගැනීම	IAEA	2.05	2018 - 2023
15. ආසියාවේ පාංශු සිතියම සහ ජාතික පාංශු තොරතුරු පද්ධති සංවර්ධනය කිරීම	AFACI	7.0	2019 - 2023
16. දකුණු ආසියාවේ දේශගුණික සුහුරු කෘෂිකර්මාන්තය ඉහළ නැංවීම සඳහා වූ සම්මේලනය	SDF	3.444	2022 - 2024
17. අගය දාම සංවර්ධනය කෙරෙහි අවධානය යොමු කරමින් කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර හරහා සාර්ක් කලාපයේ කුඩා පරිමාණ ගොවියාගේ ජීවනෝපාය වැඩි දියුණු කිරීම	SDF	15.666	2018 - 2022
18. ශාක අනුව ස්ථීර බෝග සායන වැඩසටහන	CABI	0.740	2022 - 2023

පරිච්ඡේදය 02 - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

විශේෂ ජයග්‍රහණ

<u>වී</u>

- 2022 වර්ෂයේ දී නව වී ප්‍රභේද 4 ක් හඳුන්වා දෙන ලදී.
    - Ld 376: මාස 3½ වයස් කාණ්ඩයට අයත් සුදු නාඩු ප්‍රභේදයක් වන අතර සාමාන්‍ය අස්වැන්න වියලි කලාපයේදී හෙක්ටයාරයට ටොන් 6ක්ද තෙත් කලාපයේදී හෙක්ටයාරයට ටොන් 4ක් පමණ ද වේ.
    - Bg 377: මාස 3 ½ වයස් කාණ්ඩයට අයත් සුදු නාඩු ප්‍රභේදයකි. නියඟයට මධ්‍යස්ථ වශයෙන් ඔරොත්තු දෙන මෙම ප්‍රභේදය ශ්‍රී ලංකාවේ වැසි පෝෂිත ප්‍රදේශවල වගා කිරීමට වඩාත් යෝග්‍ය වේ. සාමාන්‍ය අස්වැන්න වර්ෂාපෝෂිත තත්ව යටතේ හෙක්ටයාරයකට ටොන් 4.1 ක් වන අතර ජල සම්පාදිත තත්ත්ව යටතේ හෙක්ටයාරයකට ටොන් 6.4 කි.
    - At 378: මාස 3 ½ වයස් කාණ්ඩයට අයත් සුදු නාඩු ප්‍රභේදයකි. වියළි කලාපයේදී සාමාන්‍ය අස්වැන්න හෙක්ටයාරයකට ටොන් 7.3 ක් ද තෙත් කලාපයේදී අස්වැන්න හෙක්ටයාරයකට ටොන් 5.3 ක් ද වේ.
    - Bg 381 IP: මාස 3 ½ වයස් කාණ්ඩයට අයත් තරමක් ඇලෙන සුළු සුදු නාඩු වර්ගයක් වන අතර සුවිශේෂී සුවඳකින් යුක්ත ය. සහල් ආශ්‍රිත නිෂ්පාදන සඳහා යෝග්‍ය වේ. සාමාන්‍ය අස්වැන්න හෙක්ටයාරයකට ටොන් 6.2 කි.
- ස්වාභාවික පාංශු දිලීර යොදා ගනිමින් වී වගාව සඳහා පොස්පරස් පොහොර අවශ්‍යතාව 50%කින් අඩු කෙරෙන ජෛව පොහොරක් නිෂ්පාදනය කරන ලදී. මෙම ජෛව පොහොර අක්කරයට කිලෝග්‍රෑම් 6 ක ලෙස යෙදීමෙන් රසායනික පොස්පරස් පොහොර භාවිතා කොට ලබා ගන්නා අස්වැන්න හා සමාන අස්වැන්නක් ලබා ගත හැකි විය.
- කාබනික පොහොර භාවිතා කොට වගා කරන ලද සම්ප්‍රදායික වී වර්ග අතරින් 'මඩතවාළු' හා 'සුදු හීනටි' ප්‍රභේද අනෙක් වර්ග වලට සාපේක්ෂව ඉහළ අස්වනු ලබා දෙන බව පර්යේෂණ මඟින් හෙළි විය.
- ඩ්‍රෝන තාක්ෂණය භාවිතයෙන් වී වගා ක්ෂේත්‍රයේ වල් පැලෑටි හඳුනා ගැනීම හා ස්ථානීය වල් නාශක යෙදීම සඳහා අත්හදා බැලීම් සිදු කෙරෙමින් පවතී.

<u>අතිරේක ආහාර බෝග</u>

- සරල අනුක්‍රමික ප්‍රතිවර්තන (SSR) සළකුණු භාවිතා කොට ගොඩනඟන ලද ක්‍රමවේදය (ප්‍රොටොකෝලය) MI MZ Hy 3, MI MZ Hy 4 සහ MI MZ Hy 5 නමැති බඩඉරිඟු දෙමුහුම් ප්‍රභේදවල බීජ සහතික කිරීමේ ක්‍රියාවලිය සම්බන්ධයෙන් සාම්ප්‍රදායික වර්ධන පරීක්ෂාවට (GOT) වඩා ඵලදායි විය. තවද මෙම සොයා ගැනීම අභිජනනකරුවන්ට සහ

වගාකරුවන්ට ඉහත සඳහන් බඩඉරිඟු දෙමුහුම්වල වාණිජ බීජ තොගවල දෙමුහුම් නොවන බීජ මිශ්‍රවීම් හඳුනාගැනීමට ඉවහල් වනු ඇත.

- වියළි කලාපීය තත්ත්වයන් තුළ සාර්ථකත්වය ඇගයීමට ලක් කරන ලද ඩයස්කෝරියා විශේෂ හතළිහ අතරින් රත්නවල්ලි, කිරි අල, ඇඟිලි අල (මොණරාගල), රතඹල, හීන් ඇඟිලි අල, සූට හිඟුරල, උඩල, හිඟුරල, කිඩාරන් සහ ඇඟිලි අල මධ්‍යස්ථ අස්වැන්නක් (හෙක්ටයාරයකට ටොන් 11 - 19) ලබා දෙන අතරම යාපනය ඉන්නල, මහ කුකුළල, කුකුළල, නාත්තල, දම් පැහැති රාජ අල, රැවුල් කුකුළල, මඩකලපු රාසවල්ලි, දම් අල 1, මහ ඇඟිලි අල සහ දම් අල 2 වැඩිම අස්වැන්නක් (හෙක්ටයාරයකට ටොන් 20-30) ලබා දෙන ලදී. අනෙකුත් ඩයස්කෝරියා එකතූන් හෙක්ටයාරයකට ටොන් 9 ට වඩා අඩු අස්වැන්නක් ලබා දෙන ලදී.
- යන්ත්‍රෝපකරණ යොදා ගනිමින් වගා කිරීම පහසු කිරීම සඳහා තල සහ කුරක්කන් වැනි කුඩා බීජ ආස්තරණය කිරීම සඳහා තාක්ෂණය ගොඩනඟන ලදී.
- අස්වැන්න නෙළීමෙන් දෙසතියකට පසු මිලියනයට කොටස් 50 ක සාන්ද්‍රණයෙන් යුතු ඊතොෆෝන් ද්‍රාවණයෙහි ගිල්වා තැබීමෙන් විශාල බීජ සහිත රටකජු ප්‍රභේදවල සති 7 ක සුප්ත කාලය මගහරවා ගත හැකි විය.
- දේශීය තත්ත්වයට යෝග්‍ය වන පරිදි දැනට පවතින කව්පි කොළ මඩිනය නවීකරණය කරන ලදී.
- පැළ සිටුවීම කරන ලද (transplanted) කුඹුරුවලට හඳුන්වා දීම සඳහා 8" බලවේග වල් නෙලනයක් සැලසුම් කොට නිමවන ලදී.
- යන්ත්‍රානුසාරයෙන් මිරිස් බීජ සැකසීමේ ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා මිරිස් බීජ නිස්සාරකයක් සැලසුම් කොට නිමවන ලදී.
- බදින ලද සහ තම්බන ලද කොල්ලු පිටි එක් කොට පෝෂණීය සහ ශරීර ක්‍රියාකාරිත්වය වැඩිදියුණු කරන ක්ෂණික නිෂ්පාදනයක් ලෙස 'රසම්' කියුබ් සකසන ලදි.

<u>උද්‍යාන බෝග</u>

එළවළු

- පහත සඳහන් නව එළවළු ප්‍රභේද නිර්දේශ කරන ලදී.
  - HORDI Red: කෙටි කාලීන (මාස 5-6) ඉහළ අස්වනු ලබාදෙන මඤ්ඤොක්කා ප්‍රභේදයකි.
  - HORDI Bean 3: මැද රට තෙත් සහ අතරමැදි කලාප සඳහා උචිත ‘HORDI පොකුරු’ නමින් හැඳින්වෙන ඉහළ අස්වනු දෙන බෝංචි ප්‍රභේදයකි.
  - HORDI Curly: දිවයින පුරා වගාවට සුදුසු ඉහළ අස්වනු දෙන බිම්මල් ප්‍රභේදයකි.
  - GKEB – 1 (මැණිකේ) සහ GKEB – 2 (ටිකිරා): ඉතා ඉහළ ගුණාත්මයකින් යුක්ත එළබටු ප්‍රභේද දෙකකි.

- පාංශු සහ පොහොර විශ්ලේෂණය සඳහා ප්‍රතීතන සහතිකය (ISO/IEC 17025-2017) ලබා ගන්නා ලදි.
- එළවළු වගාවේ කුඩිත්තන් මර්ධනය සඳහා කුඩිත්තාගේ පරපෝෂිතයකු වන *Aphidius* sp. පර්යේෂණාගාර තුල ගුණනය කර ගොවීන් වෙත ලබා දීමට පහසු ක්‍රමයක් ලෙසට 'කුඩිති මරුවා' ලෙස සකසන ලද කාඩ් පත් නිපදවා ගොවි ක්ෂේත්‍ර වෙත ලබා දීම. මෙමඟින් අධික කෘමිනාශක භාවිතයෙන් තොරව එළවළු වගාවන් මෙම පළිබෝධක හානියෙන් වළක්වා ගැනීමට හැකිවී ඇත.
- බඩ ඉරිහුවල සේනා දළඹුවන් සහ එළවළු සහ අනෙකුත් බෝගවල *Spodoptera* දළඹු හානි පෙව පාලනය සඳහා බිත්තර පරපෝෂිතයන් (*Telenomus remus*) 74,000 ක් පමණ කෘතීමව ගුණනය කොට මහනුවර, හම්බන්තොට, බදුල්ල, කුරුණෑගල සහ අනුරාධපුර දිස්ත්‍රික්කවල ගොවි ක්ෂේත්‍ර වලට මුදා හැර ඇත.
- එළවලු බෝග වල කෘමිනාශක අවශිෂ්ඨ පරීක්ෂා කිරීම සඳහා එන්සයිම භාවිතා කරමින් අඩු වියදම් වේගවත් පෙව විශ්ලේෂණය තාක්ෂණයක් හඳුන්වා දෙන ලදී.
- බණ්ඩක්කා - ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම් (NCVT) අවසන් කරන ලද අතර MK Hy3 සඳහා ප්‍රභේද අනුවර්තිතා (VAT) සහ විශේෂත්වය, ඒකාකාරිත්වය හා ස්ථායිතාව (DUS) පරීක්ෂාව සිදුකෙරෙමින් පවතියි. නව දෙමුහුන් MK Hy4, MK Hy5 සහ විවෘත පරාගිත MK 8.12 ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම සඳහා නම් කරන ලදී.
- ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම් වැඩසටහන සඳහා විවෘත පරාගිත වැටකොළු - Mk 11 ප්‍රභේදය නම් කරන ලද අතර ඒ සඳහා බීජ ඉදිරිපත් කරන ලදී.

පළතුරු

- *Annona muricata* සඳහා උසස් තත්ත්වයේ ඉහළ අස්වනු දෙන වඩාත්ම හොඳ වියන් ව්‍යුහය ලෙස අතු 3-4 දක්වා රඳවා ගනිමින් කඳේ මීටර 0.8-0.9 ඉහළකින් කප්පාදු කිරීම බව හඳුනා ගන්නා ලදී.
- 'වෙල් අනෝදා' ග්‍රාහක ලෙස යොදාගනිමින් කටු අනෝදා සඳහා සාර්ථක ලෙස ස්ථානීයව බද්ධ කිරීමේ ක්‍රමයක් හඳුනා ගන්නා ලදී.
- දේශීය වෙළෙඳපොළ සඳහා ඉදිරිපත් කිරීමට 'රත් කෙසෙල්' අස්වනු නෙලීමේ වඩාත් සුදුසු අවධිය පුෂ්පීකරණයෙන් සති 13 කට පසුව බව හඳුනා ගන්නා ලදී.
- මිලියනයට කොටස් 400 ක සාන්ද්‍රණයෙන් සැලිසිලික් අම්ලය ශාක පත්‍රවලට ඉසීමෙන් කටු අනෝදාවල පුෂ්පීකරණය අභිප්‍රේරණය එකවර සිදු කිරීම කළ හැකි බව සොයා ගන්නා ලදී.
- නැප්තලික් ඇසිටික් අම්ලය (NAA) මිලියනයට කොටස් 5000 ක සාන්ද්‍රණයෙන් ඉසීමෙන් අනෝදාවල සුප්තතාව අඩු කළ හැකි බව සොයා ගන්නා ලදී.

- මැකඩමියා සඳහා සාර්ථක බීජ ප්‍රරෝහණ ක්‍රමයක් හඳුනා ගන්නා ලදී.
- ස්වභාවික බිම්මල් ප්‍රභේදයක් වන මාකඳුර දුඹුරු ප්‍රභේදය සඳහා වගා කිරීමේ තාක්ෂණය බිහි කර ඇත.
- 'කොත්මලේ' කොස් සහ 'උළුහිටි' දෙල් ප්‍රභේදයේ පිටි අගය එකතු කළ නිෂ්පාදන සඳහා සුදුසු බව සොයා ගන්නා ලදී.
- 50% තිරිඟු පිටි + 10% කොස් මදුළු පිටි සහ 40% කොස් ඇට පිටි මිශ්‍රණය අතින් සාදනු ලබන නූඩිල්ස් නිෂ්පාදනය සඳහා සුදුසු බව සොයා ගන්නා ලදී.
- ලොවි සහ කාමරංගා භාවිතයෙන් අගය එකතු කළ නිෂ්පාදන දෙකක් හඳුන්වා දෙන ලදී. පෙව ක්‍රියාකාරී සංයෝග ඇගයීම සිදු කෙරෙමින් පවතියි.
- ට්‍රයිකොඩර්මා සුළු පරිමාණයෙන් බහු ගුණනය කිරීම සඳහා ලාභදායී වාහක මාධ්‍ය ලෙස වල් සූරියකාන්ත (*Tithonia diversifolia*), පෝටවැල් (*Pothos scandens* L.) සහ කැප්පෙටියා හඳුනා ගනු ලැබ ඇත.
- දෙළුම් ඵල කුණු වීමේ රෝගයට හේතු වන රෝග කාරක ලෙස *Aspergillus violaceofuscus, Lasiodiplodia theobromae, Phompsis spp., Diaporthe discodispora* සහ *Pestalotiopsis spp.* නමැති විශේෂ තහවුරු කරන ලදී.
- දෙළුම් වල ඇන්ත්‍රැක්නෝස් රෝගය ඇති කරන *Colletotricum gloeosporiodes* සඳහා පරිසර හිතකාමී පාලන ක්‍රම හඳුනාගෙන ඇත.
- කෙසෙල්වල ඇන්ත්‍රැක්නෝස් රෝගය ඇති කරන *Colletotrichum musae* ට එරෙහිව තෝරාගනු ලැබූ ශාක නිස්සාරකවල, නලස්ථව ප්‍රති-දිලීර විභවය හඳුනාගෙන ඇත.
- මුකුණුවැන්න (*Alternanthera sessile*) වල *Cercospora* පත්‍ර ලප සහ සුදු මලකඩ රෝගයේ තීව්‍රතාවය, කොහොඹ තෙල් (3 ml/L), පැණිරි තෙල් (3 ml/L) සහ කරාබු කොළ නිස්සාරකය (350 g/L) ඉසීමෙන් සැලකිය යුතු ලෙස අඩුවන බව සොයා ගන්නා ලදී.
- පැපොල් මුදු පුල්ලි වෛරසයේ ප්‍රෝටීන කොපුවට අදාළ ප්‍රෝටීන සංස්ලේෂණය වන පරිදී *Agrobacterium* බැක්ටීරියාව මගින් ජාන පථය ඇතුළත් කිරීම හරහා මුදු පුල්ලි වෛරස රෝගය සඳහා ප්‍රතිරෝධී පැපොල් ශාක නිපදවන ලදී.
- අණුක ක්‍රම මගින් පැෂන් ෆෘට්වල වෛරස් රෝග හඳුනාගෙන ඇති අතර කල්තියා පැෂන් ෆෘට් මොට්ල් වෛරසය හඳුනා ගැනීම සඳහා නිශ්චිත හඳුනාගැනීමේ ක්‍රමයක් සකස් කරනු ලැබ ඇත.
- නෙමටෝඩා වලින් තොර පේර රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම සඳහා බඳුනකට මිලි ලීටර් 1 අනුපාතයෙන් 400 l/SC සාන්ද්‍රණයෙන් යුත් ෆ්ලූපයිරම්වල පොහවා ගැනීම නිර්දේශ කරන ලදී.

- කෙසෙල් මුල් ගුල්ලා මර්දනය සඳහා ෆෙරමෝන් ඩිස්පෙන්සර් කට්ටල පොළොව මට්ටමෙන් මීටර් 20 ක පරතරයකින් සවි කිරීම මාස 3 ක කාලයක් සඳහා ඵලදායී බව සොයා ගන්නා ලදී.
- පරීක්ෂාවට බඳුන් කරන ලද කොහොඹ නිෂ්පාදන දෙකක්ඉසීමෙන් දින 7කට පසු අඹවල යුෂ උරා බොන පළිබෝධක වර්ග දෙකටම (*Aulacaspis* spp. සහ රෙඩ් ස්පයිඩර් මයිටාවන්) එරෙහිව ධනාත්මක ප්‍රතිඵල දැකගත හැකි විය.
- කොස්ටරිකන් පේර ග්‍රාහක සමඟ පේර පැල බද්ධ කිරීමෙන් පේර වල මූල ගැටිති නෙමටෝඩාවන් පාලනය කළ හැකි බව හඳුනා ගන්නා ලදී.
- *Eudocima* විශේෂ දෙකක් ඇතුළු පලතුරු යුෂ උරා බොන සලබ විශේෂ කිහිපයක් තෙත් කලාපීය ගෙවතුවල පැහිරි භෝග සමඟ මිශ්‍රව වැඩුණු කාමරංගා බෝගවලින් හඳුනා ගන්නා ලදී.
- කාබනික අන්නාසි නිෂ්පාදනය සඳහා සුදුසු පෝෂක කළමනාකරණ පිළිවෙත් හඳුනා ගන්නා ලදී.
- වසරකට පැළයකට සින්ක් සල්ෆේට් ග්‍රෑම් 200ක් සහ මැග්නීසියම් සල්ෆේට් ග්‍රෑම් 200ක් පසට යෙදීමෙන් කහ මැන්ඩරින් ඵලයේ ගුණාත්මය වැඩි වන බව සොයා ගන්නා ලදී.
- සාරවත් කාබනික පොහොර නිපදවීම සඳහා තෝරාගනු ලැබූ විවිධ මහා සහ ක්ෂුද්‍ර පෝෂක ඇතුලත් කළ ජෛව අඟුරු වර්ග හතරක් නිෂ්පාදනය කර ඇත. කෙසෙල් ව්‍යාජ කඳෙන් නිපදවන ජෛව අඟුරු පෝෂක අවශෝෂණය කිරීමේ ඉහළ හැකියාවක් පෙන්නුම් කර ඇත.
- මුරුෂිගේ සහ ස්කූග් මූලික මාධ්‍යය සහ කාෂ්ඨීය ශාක මාධ්‍ය යන මාධ්‍යයන් දෙකෙහිම 6-BAP සහ කයිනටින් සංයෝජනය කිරීමෙන් දෙල්වල ක්ෂුද්‍ර ප්‍රචාරණය සාර්ථක කර ගන්නා ලදි.
- පටක රෝපණ කෙසෙල් පැල පන්දහසක් නිෂ්පාදනය කර ගොවීන් අතර බෙදා හරින ලදී. පටක රෝපිත පැල නිෂ්පාදනය කිරීම සඳහා නව ගුණ කිරීම් දහසක් රෝපණ මාධ්‍යයේ ස්ථාපිත කර ඇත.
- අඹ වල පසු අස්වනු දිලීර රෝග පාලනය කිරීම සඳහා ලැක්ටික් අම්ල පැසවීමෙන් නිපදවන ස්වභාවික අතුරු නිෂ්පාදන යොදාගැනීමේ තාක්ෂණය හඳුන්වා දෙන ලදී.
- රත්න සහ Cp-13 යන දෙමාපිය පරම්පරාව හරහා හොරණ පැපොල් දෙමුහුන් -1 අභිජනන බීජ කිලෝග්‍රෑම් එකක් නිෂ්පාදනය කරන ලදී.
- හොරණ ගෝල්ඩ් පැෂන් ෆෘට් අභිජනන බීජ කිලෝග්‍රෑම් දෙකක් නිෂ්පාදනය කරන ලදී.
- පොකුරු ගම්මානයක් සංවර්ධනය කිරීම සඳහා රහංගල ප්‍රදේශයේ ගොවීන් 200ක් අතර කහ මැන්ඩරින් ප්‍රභේද තුනකින් (හොරණ එහිමි 01; එහිමි 02; එහිමි 03) බද්ධ පැල 10,000ක් බෙදා දෙන ලදී.

<u>ස්වාභාවික සම්පත් කළමනාකරණය</u>

- කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ අනාවැකි සහ ශ්‍රී ලංකා මහවැලි අධිකාරියෙහි, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙහි සහ ගොවිජන සේවා දෙපාර්තමේන්තුවෙහි තාක්ෂණික විශේෂඥයින්ගෙන් සමන්විත කෘෂි දේශගුණික උපදේශක කමිටුවක තාක්ෂණික උපදේශන පාදක කරගනිමින් කෘෂිකාර්මික නිෂ්පාදනයට දේශගුණික විපර්යාසවල බලපෑම අවම කිරීම සඳහා මාසික කෘෂි කාලගුණ උපදේශන නිකුත් කරන ලදී.
- ජාතික කෘෂි කාලගුණ විද්‍යා දත්ත නිරීක්ෂණ ජාලය සාර්ථකව පවත්වාගෙන යන අතර ත්‍රිකුණාමලය දිස්ත්‍රික් කෘෂිකර්ම පුහුණු මධ්‍යස්ථානයෙහි නව කෘෂි කාලගුණ ඒකකයක් ස්ථාපිත කරන ලදී.
- මොරගහකන්ද නව විශේෂ කාබනික කලාපය (හෙක්ටයාර 3,410) සඳහා පාංශු විශ්ලේෂණය පදනම් කරගත් ඉඩම් යෝග්‍යතා ඇගයීමක් සිදු කොට සිතියම්ගත කිරීම සහ ප්‍රදේශය අනුව බෝග නිර්දේශ වාර්තා සකස් කිරීම අවසන් කෙරිණ.
- අඹ, දෙළුම්, රඹුටන්, මැංගුස්, දුරියන් සහ කෙසෙල් සඳහා ශ්‍රී ලංකාවෙහි විභවය සිතියම් ගත කරන ලදී.
- පාංශු සංරක්ෂණ පනත මගින් ආවරණය වන සංවේදී කලාපවල සංවර්ධන කටයුතු සඳහා කෘෂිකාර්මික පාංශු සංරක්ෂණ සැලසුම්, වැසි ජල අපවහන සැලසුම්, ඉඩම් සංවර්ධන සිතියම්, ඉංජිනේරු සිතියම් සහ උපදේශන කලාප වෙන් කිරීම සඳහා සිතියම් සකස් කරන ලදී.
- කෘෂි උපදේශන කලාප වෙන් කිරීම සඳහා GIS සිතියම් සකස් කරන ලදී.
- ශ්‍රී ලංකාවේ දේශගුණයට හිතකර කෘෂිකාර්මික පිළිවෙත් පිළිබඳ සවිස්තර වාර්තාවක් සකස් කරන ලදී.
- "පාංශු හා ජල සංරක්ෂණ තාක්ෂණික අත්පොත" 2022 දී ප්‍රකාශයට පත් කරන ලදී.

<u>සමාජ ආර්ථික සහ සැලසුම්</u>

- අතිරේක ආහාර බෝග සහ එළවළු සඳහා ජාතික වශයෙන් ප්‍රභේද වාර්තාවක් ඇතුලත් කර දැනට පවතින බෝග වගාව පිළිබඳ යාවත්කාලීන තොරතුරු සක්‍රීයව සපයන වෙබ් පාදක බෝග පුරෝකථන පද්ධතියක් වන croplook.net වෙබ් අඩවිය තවදුරටත් වැඩි දියුණු කරන ලදී.
- 2021/22 මහ කන්නයේ බෝග නිෂ්පාදන පිරිවැය සහ ප්‍රතිලාභ ප්‍රකාශනය නිකුත් කර ඇති අතර. නිෂ්පාදන යෙදවුම් භාවිතය, දළ අස්වැන්න, සම්පූර්ණ වගා පිරිවැය, නිෂ්පාදන ඒකක පිරිවැය, ගොවි බිමේදී මිල සහ එක් එක් බෝග සඳහා දළ සහ ශුද්ධ ප්‍රතිලාභ මෙම ප්‍රකාශනයේ ඇතුලත් කර ඇත.
- 2021/22 මහ, 2022 යල, සහ 2022/23 පෙර මහ කන්න ආවරණය කරමින් 2022 තුළ බෝග පුරෝකථන වාර්තා දහයක් (කන්නයකට පහක්) සකස් කරන ලදී.

- එළවලු වගාකරුවන්ට තම නිෂ්පාදන සඳහා වඩා හොඳ මිලක් ලබා ගැනීමට සහ වෙළඳපොලේ ඇති විය හැකි අතිරික්ත සහ ඌනතා අවම කර ගැනීම සඳහා නියම වේලාවට වගා කළ යුතු නිවැරදි බෝගය සහ වපසරිය පිළිබඳ දර්ශකයක් ලෙස 'එළවළු පූර්ව අනතුරු ඇඟවීමේ පණිවිඩ පද්ධතියක්' හඳුන්වා දෙන ලදී.
- නිෂ්පාදනය (කන්නමය), ප්‍රමාණය, අස්වනු කාලසටහන, ආනයන, බෝග සුලභතාවය සහ මිල ප්‍රවණතා පිළිබඳ තොරතුරු අඩංගු 'Crop Watch' ප්‍රකාශනය මාසිකව යාවත්කාලීන කරන ලදී.
- තෝරාගනු ලැබූ උඩරට සහ පහතරට එළවළු භෝග 14ක් සඳහා වූ ප්‍රභේද විස්තරය 2022 වාර්ෂික ප්‍රකාශන මාලාවේ දෙවැනි වරටත් සම්පාදනය කරන ලද 'ශ්‍රී ලංකාවේ එළවළු ප්‍රභේද පැතිරීම' 2022 වර්ෂයේ වෙළුමට ඇතුළත් කරන ලදී.
- 2021 වසර සඳහා සමාජ ආර්ථික දත්ත, ඉඩම් පරිහරණ වර්ගය, වපසරිය සහ නිෂ්පාදනය, ආනයන හා අපනයන සංඛ්‍යාලේඛන, ඒක පුද්ගල ආහාර බෝග ලබා ගැනීමේ හැකියාව සහ ඒවායේ තොග සහ සිල්ලර මිල ඇතුළු ආහාර බෝග පිළිබඳ සංඛ්‍යාලේඛන තොරතුරු අඩංගු AgStat හි XIX වෙළුම සම්පාදනය කර ඇත.
- 2022 වර්ෂයට අදාළව පලතුරු බෝග සහ මල් වගා බෝග ව්‍යවසාය අයවැය සකස් කිරීම සඳහා පලතුරු බෝග දොළහක් (දොඩම්, දෙහි, පැෂන් ෆෘට්, අන්නාසි, රඹුටන්, පැපොල්, අඹ, කෙසෙල්, දුරියන්, කටු අනෝදා, පේර සහ අලිගැට පේර) පිළිබඳ දත්ත රැස් කර ඇති අතර බෝග අයවැය සකස් කරමින් පවතී.

<u>ව්‍යාප්තිය සහ පුහුණුව</u>

- 2022 වසරේ ඇති වූ කොවිඩ් වසංගත තත්ත්වය සහ පොහොර පිළිබඳ ප්‍රතිපත්තිමය තීරණ මධ්‍යයේ වුවද ක්ෂේත්‍ර මට්ටමින් මගපෙන්වීම සහ තාක්ෂණික දැනුම ලබාදීම තුළින් වී හෙක්ටයාර 1,300,798ක් වගා කර මෙ.ටොන් 3,564,000ක් අස්වැන්න ලබාගන්නා ලදී. මෙය 2022 ජාතික අවශ්‍යතාවයෙන් 83.3%ක් පමණ වේ.
- ගොවීන්ගේ ජීවනෝපාය නඟා සිටුවීමට සහ සත්ව ආහාර සැපයුම් අවශ්‍යතා සපුරාලීම සඳහා බඩඉරිඟු හෙක්ටයාර 67,000ක් වගා කිරීමට හැකි වූ අතර එමගින් මෙට්‍රික් ටොන් 220,000ක අස්වැන්නක් ලබා දුනි. මේ සඳහා ජයිකා ආයතනයේ හා තායිලන්ත තානාපති කාර්යාලයේ සහය යටතේ ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානයේ සෘජු මැදිහත්වීමෙන් ගොවීන් 34,000කට බඩඉරිඟු අක්කර 34,000ක් වගා කිරීම සඳහා නොමිලේ බීජ ලබා දෙන ලදී.
- බීජ ආනයනය සඳහා වැය වන විදේශ විනිමය ඉතිරි කර ගැනීම සඳහා, 2022 යල කන්නය සඳහා බීජ නිෂ්පාදන වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලද අතර, එමඟින් දේශීය MI MZ Hy 05 දෙමුහුන් බීජ මෙ.ටොන් 35ක් නිෂ්පාදනය කරන ලදී. මෙම බීජ මඟින් ගොවීන් සඳහා අත්හදා බැලීම් ලෙස අක්කර 01ක ආදර්ශන බිම් 1,700ක් ස්ථාපිත කිරීමට

හැකි විය. තවද, බේබි කෝන් නිෂ්පාදනය සඳහා ගොවීන් අතර දේශීය විවෘත පරාගිත බඩ ඉරිහු ප්‍රභේද ප්‍රචලිත කිරීම සඳහා අක්කර 01ක ආදර්ශන බිම් 1,300ක් ස්ථාපිත කෙරිණ.

- බඩඉරිහු වගාව යාන්ත්‍රික කිරීම සහ ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා ලේසර් මට්ටම් කිරීමේ යන්ත්‍ර 04ක් මිල දී ගෙන ඇති අතර අනුරාධපුර, අම්පාර, හසලක සහ මොනරාගල යන ප්‍රදේශවල ආදර්ශන 40ක් ස්ථාපිත කර අදාළ තාක්ෂණය ගොවීන්ට ලබා දෙන ලදී.
- ගොවීන් අතර ඒකාබද්ධ පළිබෝධ කළමනාකරණ ක්‍රම ප්‍රචලිත කිරීමෙන් 2022/23 මහ කන්නයේ බඩඉරිහු වගාවේ වසංගතයක් ලෙස ඇති වූ සේනා දළඹු හානිය 3% කට වඩා අඩු කළ හැකිය.
- 2022 වර්ෂයේ දී මිරිස් හෙක්ටයාර් 4,958ක් වගා කිරීමට හැකි වූ අතර, ටොන් 49,578ක් නිෂ්පාදනය කිරීමට හැකි විය. දේශීය දෙමුහුන් ප්‍රභේද MI CH Hy 01 වගා කිරීම සහ අනෙකුත් තාක්ෂණික පැකේජ ගොවීන් අතර ප්‍රචාරණය කිරීම තුළින් හෙක්ටයාරයකට අස්වැන්න මෙට්‍රික් ටොන් 10 දක්වා වැඩි කර ගැනීමට හැකි විය.
- 2022 දී, පැවති COVID-19 වසංගත තත්ත්වය හමුවේ උද්ගත වූ ආර්ථික අවපාතය සහ පොහොර හිඟය යටතේ වුවද, ජාතික ඉල්ලුම සපුරාලීම සඳහා අතිරේක ආහාර බෝගවල වගා ප්‍රමාණයන් මිරිස් හෙක්ටයාර් 8,824, ඵැනු හෙක්ටයාර් 2,365, රතු ඵැනු හෙක්ටයාර් 2,995, සෝයා බෝංචි හෙක්ටයාර් 6,046, මුං හෙක්ටයාර් 10,577, කව්පි හෙක්ටයාර් 9,206, තල 10,547, රටකජු හෙක්ටයාර් 15,906 සහ අර්තාපල් හෙක්ටයාර් 2,388 ලෙස පවත්වා ගෙන යන ලදී.
- යහපත් කෘෂිකාර්මික පිළිවෙත් (GAP) ගොවීන් අතර ප්‍රචලිත කිරීමට සහ උසස් තත්ත්වයේ සෞඛ්‍යාරක්ෂිත එළවළු සහ පලතුරු ඇතුළු කෘෂිකාර්මික නිෂ්පාදන වෙළෙඳපොළට නිකුත් කිරීමට GAP සහතිකය සහිත ගොවිපල 710ක් ලියාපදිංචි කිරීමට හැකි විය. එමෙන්ම සෞඛ්‍යාරක්ෂිත සහල් නිෂ්පාදනය සඳහා GAP සහතික කළ වී ගොවිපල අක්කර 400ක් ලියාපදිංචි කර ඇත.
- තාරුණ්‍යයට කෘෂිකාර්මික තාක්ෂණය හා දැනුම ලබාදීම සහ නව කෘෂිකාර්මික ව්‍යවසායකයින් බිහිකිරීම සඳහා 2022 වර්ෂයේදී කෘෂිකර්ම විද්‍යාල හරහා NVQ 05 ජාතික ඩිප්ලෝමාධාරීන් 203 දෙනෙක් සහ NVQ 06 උසස් ජාතික ඩිප්ලෝමාධාරීන් 351 දෙනෙක් ඩිප්ලෝමා ලබා ගන්නා ලදී.
- මධ්‍යම සහ ඌව පළාත් ආවරණය වන පරිදි රජයේ පාසල් 400ක ව්‍යවසායකත්ව පාසල් උද්‍යාන වැඩසටහන් 400ක් පවත්වන ලදී.
- තරුණ පරම්පරාවන් අතර ගොවිතැන ප්‍රචලිත කිරීම සඳහා සබරගමුව පළාතේ තරුණ ගොවීන් කණ්ඩායම් 50කගේ සහභාගිත්වයෙන් ගොවි ප්‍රශ්න විචාරාත්මක තරඟ පවත්වන ලදී.

- කෘෂිකාර්මික පාදක ආහාර තාක්ෂණය ප්‍රවර්ධනය කිරීම සහ පාරිභෝගිකයින් අතර ශ්‍රී ලාංකීය දේශීය පෝෂ්‍යදායී ආහාර ප්‍රවර්ධනය කිරීම සඳහා මාතලේ අලුවිහාරය සහ තෙළුල්ල ප්‍රදේශ ආවරණය වන පරිදි 'හෙළ බොජුන්' අලෙවිසැල් පිහිටුවා ඇත.

<u>කෘෂිකර්ම තොරතුරු සහ සන්නිවේදනය</u>

- වර්ෂය තුළ රූපවාහිනී වැඩසටහන් 225 ක් සහ කෙටි වීඩියෝ පණිවිඩ 13 ක් විකාශය කරන ලද අතර නව කෘෂිකාර්මික තාක්ෂණය ගොවි ප්‍රජාවට සහ අනෙකුත් අදාළ පාර්ශ්වකරුවන් වෙත බෙදා හැරීම සඳහා YouTube කෙටි වීඩියෝ 281 ක් අන්තර්ජාලයට උඩුගත කරන ලදී. වර්ෂය තුළදී ගුවන්විදුලි වැඩසටහන් 2,509 ක් සහ කෙටි වැඩසටහන් 756 ක් විකාශනය කර ඇත.
- නව පොත් පිටපත් 259,394 ක්, අත් පත්‍රිකා 78,000 ක් සහ කෘෂිකාර්මික පෝස්ටර් පිටපත් 1,280 ක් මුද්‍රණය කර බෙදා හැර ඇති අතර කෘෂිකාර්මික ප්‍රකාශන අලෙවියෙන් උපයා ගත් ආදායම රු. 389,989 කි.
- ගන්නෝරුව සහ බටඅත කෘෂිකාර්මික උද්‍යාන වෙත දේශීය නරඹන්නන් 81,965 ක් සහ විදේශීය නරඹන්නන් 422 ක් හරහා උපයා ඇති ආදායම රු. මිලියන 7.24 කි.
- කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සහ පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ පුහුණු වැඩසටහන් 16ක් පවත්වන ලදී.
- පාංශු පරීක්ෂණ වාර්තා කළමනාකරණ පද්ධති අදියර I සහ II, පළිබෝධනාශක ලියාපදිංචි කිරීම, බීජ වෙළඳපල පද්ධතිය සහ වත්කම් කළමනාකරණය, කෘෂිකර්ම විද්‍යාල කළමනාකරණ පද්ධතිය I සහ II අදියර, මූල්‍ය දත්ත පද්ධතිය සහ ශාක ජාන සම්පත් MIS අදියර I සංවර්ධනය කොට කළමනාකරණය කරන ලදී.
- 1920 ගොවි උපදේශන සේවාව හරහා ප්‍රශ්න 60,327කට පිළිතුරු සපයන ලදි.
- තොරතුරු ලබාගැනීමට අවශ්‍ය පාර්ශ්වකරුවන්ට නිවැරදි විශ්වාසදායක කෘෂිකාර්මික තොරතුරු කඩිනම් ලබාගැනීමේ හැකියාව, ගබඩා කර තබා ගැනීම සහ බෙදා හැරීම සඳහා කෘෂිකර්ම තොරතුරු ඒකකයක් (AgIU) ස්ථාපිත කරන ලදී.
- විවිධ මාධ්‍යවල (පොත්, පත්‍රිකා, සඟරා, පෝස්ටර්, ලිපි, වෙබ් ලිපි, වීඩියෝ වැඩසටහන්, ශ්‍රව්‍ය වැඩසටහන්) බෝග තොරතුරු වලින් සමන්විත 'කෘෂි ඊ-පුස්තකාලය' සෙවීමේ පහසුකම සහිත වෙබ් වේදිකාවක් ලෙස සංවර්ධනය කර ඇත.
- 2022 ජාතික කියවීමේ මාසය තුළ 'හරිත යාය' ත්‍යාග ප්‍රදානෝත්සවය සංවිධානය කරන ලද අතර තරුණයින් අතර කෘෂිකර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සඳහා සිසුන් 150 කට වැඩි පිරිසකට ත්‍යාග සහ සහතිකපත් ප්‍රදානය කරන ලදී.
- 2022 ජාතික ඵලදායිතා සම්මාන උළෙලේදී බට අත කෘෂි තාක්ෂණ උද්‍යානයට ප්‍රශංසා සහතිකයක් හිමි විය.

- Best web.lk domain වෙබ් අඩවිය මගින් පවත්වනු ලබන 2022 හොඳම වෙබ් අඩවි තේරීමේ තරගයේ කුසලතා සහතිකයක් ලබා ගැනීමට කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියට හැකි විය.
- 2022 අප්‍රේල් 26 දින පැවති ජාතික ඵලදායිතා සම්මාන උළෙලේදී ගොවි ගුවන්විදුලි සේවයේ කොළඹ ඒකකයට ප්‍රශංසා සහතිකයක් හිමි විය.

<u>බීජ සහ රෝපණ ද්‍රව්‍ය සංවර්ධනය</u>

- රජයේ බීජ ගොවිපලවල 2021/22 මහ සහ 2022 යල කන්න තුළ ලියාපදිංචි බිත්තර වී නිෂ්පාදනය පිළිවෙලින් බුසල් 67,519 ක් සහ බුසල් 47,077 ක් වූ අතර, ගොවිපලවල වාර්ෂික ලියාපදිංචි බිත්තර වී නිෂ්පාදනය බුසල් 114,596 ක් විය.
- කොන්ත්‍රාත් බීජ නිෂ්පාදන වැඩසටහන හරහා ලියාපදිංචි බිත්තර වී බුසල් 8,755ක් නිෂ්පාදනය කරන ලදී. මේ අනුව, 2022 වසරේ සමස්ත ලියාපදිංචි බිත්තර වී නිෂ්පාදනය බුසල් 123,351ක් වූ අතර එය සමස්ත ජාතික අවශ්‍යතාවයෙන් 76%ක් පමණ වේ.
- කොන්ත්‍රාත් බිත්තර වී නිෂ්පාදන වැඩසටහන යටතේ ලියාපදිංචි, සහතික කළ සහ වාණිජ බිත්තර වී බුසල් 26,723ක් මිලදී ගෙන ඇත.
- 2022 තුළ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් බිත්තර වී බුසල් 137, 451ක් පමණ නිකුත් කර ඇත. (2022 යල - බුසල් 60,204 සහ 2022/23 මහ -බුසල් 77.245).
- බඩඉරිඟු දේශීය දෙමුහුන් බීජ සැපයුම ඉහළ නැංවීම සඳහා දෙමුහුන් බඩඉරිඟු මාපිය ආර බීජ නිෂ්පාදනය ආරම්භ කර ඇත. දෙමුහුන් බඩඉරිඟු මාපිය ආර බීජ කිලෝ ග්‍රෑම් 2821.2 ක් රජයේ බීජ ගොවිපලවල නිෂ්පාදනය කරන ලදී.
- රජයේ බීජ ගොවිපලවල් සහ කොන්ත්‍රාත් වගා ක්‍රමය යටතේ අතිරේක ආහාර බෝගවල අත්තිවාරම් බීජ කිලෝ ග්‍රෑම් 19,098.5ක් සහ ලියාපදිංචි බීජ කිලෝ ග්‍රෑම් 206,742.4ක් නිෂ්පාදනය කරන ලදී.
- 2022 වසරේදී මිරිස් දෙමුහුම් බීජ කිලෝ ග්‍රෑම් 150ක් පමණ නිෂ්පාදනය කරන ලදී.
- 2022 යල සඳහා වෙනත් ක්ෂේත්‍ර බෝග බීජ ටොන් 368.3ක් නිකුත් කර ඇති අතර, 2022/23 මහ සඳහා වෙනත් ක්ෂේත්‍ර බෝග බීජ ටොන් 514.7ක් නිකුත් කර ඇත.
- 2022 වසරේ ප්‍රරෝහණය පරීක්ෂා කරන ලද බීජ ඇතුළුව වෙනත් ක්ෂේත්‍ර බෝග බීජ වාර්ෂික සැපයුම කිලෝ ග්‍රෑම් 46,155.8 කි.
- එළවළු බෝග 12 ක ප්‍රභේද 26ක බීජ ගුණනය කර අභිජනන බීජ භාවිතයෙන් බීජ නිෂ්පාදනය කරන ලදී. ඒ අනුව යල සහ මහ දෙකන්නයේ මූලික එළවළු බීජ කිලෝ ග්‍රෑම් 1,882.2ක් නිෂ්පාදනය කරන ලද අතර එය 2021 වසරට සාපේක්ෂව 27% ක වර්ධනයකි.
- 2022 වර්ෂයේ පැවති පශ්චාත් කොවිඩ් වසංගත තත්ත්වය හමුවේ රසායනික පොහොර, පළිබෝධනාශක වැනි සීමිත සම්පත් මගින් සම්මත එළවළු බීජ කිලෝ ග්‍රෑම් 15,653.59ක් නිෂ්පාදනය කිරීමට හැකි විය.

- පොළොන්නරුව, බටඅත, පැල්වෙහෙර, වල්පිට, අඹේපුස්ස, කුණ්ඩසාලේ සහ අළුත්තරම ගොවිපළවල දෙමුහුන් එළවළු බීජ නිෂ්පාදනය සාර්ථකව සිදු කරන ලද අතර කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් නිර්දේශිත එළවළු බෝග 5ක, ප්‍රභේද 7කින් F_1 දෙමුහුන් බීජ කිලෝ ග්‍රෑම් 93.78ක් නිෂ්පාදනය කරන ලදී.
- කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ බීජ අලෙවිසැල්, ලක් කෘෂි අලෙවි නියෝජිතයන් වෙත සහ කෘෂිකර්ම අමාත්‍යාංශය මගින් පවත්වනු ලබන වැඩසටහන් සඳහා එළවළු බීජ සපයන ලදී. 'සෞභාග්‍යා' ගෙවතු වගා වැඩසටහන යටතේ ගෙවතු වගා ඇසුරුම් මිලියන 2.5ක් සකස් කර කෘෂිකර්ම අමාත්‍යාංශය, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව, මහවැලි අධිකාරිය සහ අනෙකුත් රාජ්‍ය ආයතන හරහා බෙදාහරින ලදී. මීට අමතරව, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අලෙවිසැල් සහ ලියාපදිංචි අලෙවි නියෝජිත ජාලය හරහා එළවළු බීජ බෙදා හරින ලදී.
- ගොවී ස්වයං-බීජ නිෂ්පාදනය වැඩි කිරීම සඳහා ගොවීන් සඳහා පූර්ව මූලික බීජ අර්තාපල් (G_0 සහ G_1) සැපයීම සඳහා නව පොලි ගෘහ සංකීර්ණයක් ස්ථාපිත කරන ලදී. සමස්ත මූලික සහ සහතික කළ බීජ අර්තාපල් නිෂ්පාදනය පිළිවෙලින් මෙට්‍රික් ටොන් 1,551.96ක් සහ මෙට්‍රික් ටොන් 47.55ක් වූ අතර G_0 සහ G_1 බීජ අර්තාපල් නිෂ්පාදනය පිළිවෙලින් ක්ෂුද්‍ර ආකන්ද 2,180,265ක් සහ මෙට්‍රික් ටොන් 20.5ක් විය.
- 2022 වර්ෂය තුළ මූලික සහ සහතික කළ බීජ අර්තාපල් මෙට්‍රික් ටොන් 477.1ක් සහ ග්‍රැනෝලා ප්‍රභේදයේ ක්ෂුද්‍ර ආකන්ද 963,650ක් සපයන ලදී.
- බද්ධ පැළ, බීජ පැළ සහ මුල් ඇද්දවූ දඬු කැබලි 854,828ක් පමණ නිෂ්පාදනය කරන ලද අතර පැළ 610,897ක් නිකුත් කරන ලදී.
- බිම්මල් බීජ නිෂ්පාදන වැඩසටහන යටතේ Abaloni, American Oyster සහ Bhuthan Oyster යන වර්ග තුනක බීජාණු නිෂ්පාදනය කර සපයන ලදී. 2022 වර්ෂයේදී පැකට් 18,645 (ග්‍රෑම් 200) නිෂ්පාදනය කළ අතර පැකට් 17,766 (ග්‍රෑම් 200) සපයන ලදී.

<u>බීජ සහතික කිරීම සහ ශාක ආරක්ෂණය</u>

- ජාතික බීජ නිෂ්පාදන වැඩසටහන සඳහා අවශ්‍ය මූලික බීජ නිෂ්පාදනය සඳහා බිත්තර වී මෙට්‍රික් ටොන් 10,154ක්, වෙනත් ක්ෂේත්‍ර බෝග බීජ මෙට්‍රික් ටොන් 821.62ක්, එළවලු බීජ මෙට්‍රික් ටොන් 34.45ක්, බීජ අර්තාපල් මෙට්‍රික් ටොන් 589.78ක් සහ ක්ෂුද්‍ර ආකන්ද 2,900,327ක් සහතික කර ඇත. රජයේ සහ පෞද්ගලික අංශයේ බද්ධ පලතුරු පැළ 724,898 ක් සහතික කර ඇති අතර බද්ධ පලතුරු පැළ නිෂ්පාදනය සඳහා මවු පැළ 530 ක් සිටුවා ඇත.
- දිවයින පුරා 150කට අධික ගොවි සමිති, මහවැලි අධිකාරිය, අර්ධ රාජ්‍ය ආයතන, පෞද්ගලික ආයතන සහ රාජ්‍ය නොවන සංවිධානවල බීජ නිෂ්පාදකයින් 10,741කට අධික සංඛ්‍යාවකට බීජ සහතික කිරීමේ පහසුකම් සපයන ලදී.

- 2003 අංක 22 දරන බීජ පනත යටතේ බීජ හසුරුවන්නන් 1,266ක් ලියාපදිංචි කර ඇති අතර ලියාපදිංචි කිරීම් 1,227ක් අලුත් කර ඇත. 2022 වසර අවසන් වන විට ලියාපදිංචි බීජ සහ රෝපණ ද්‍රව්‍ය හසුරුවන්නන් සංඛ්‍යාව 16,900 ඉක්මවන ලදී. වෙළඳපොලේ විකිණීමට ඇති සියලුම වර්ගවල සහ ප්‍රමාණයන්වල බීජ පැකට් සඳහා අනුමත ලේබල් යොදන ලදී. සියලුම බීජ ඇසුරුම් ආරක්ෂිත ත්‍රිත්ව ඇලුමිනියම් ආවරණයක අසුරන ලෙසට උපදෙස් දෙන ලදී.
- බීජ පනත යටතේ ලියාපදිංචි වී ඇති බීජ හසුරුවන්නන් මනාව හඳුනා ගැනීම පිණිස වෙබ් පිටුවක් නිර්මාණය කරන ලදී.
- යහපත් කෘෂිකාර්මික පිළිවෙත් අනුගමනය කරන ගොවිපලවල තත්වය සහතික කිරීම සඳහා ගොවිපල 808ක් විගණනය කරන ලද අතර එයින් ගොවිපල 710ක් යහපත් කෘෂිකාර්මික පිළිවෙත් සහිත ගොවිපල ලෙස සහතික කරන ලදී.
- පුහුණු රාජ්‍ය නිලධාරීන් සහ බීජ නිෂ්පාදකයින් 1,376 දෙනෙකු වී, එළවළු, පළතුරු සහ වෙනත් ක්ෂේත්‍ර බෝග වල සහතික කළ බීජ නිෂ්පාදනය පිළිබඳව පුහුණු කරන ලදී.
- නව වී වර්ග, එළවළු, පළතුරු සහ වෙනත් ක්ෂේත්‍ර බෝග වර්ග නිකුත් කිරීමට පහසුකම් සැලසීම සඳහා DUS පරීක්ෂණ 61ක් සිදු කරන ලදී.
- වී සහ බඩ ඉරිඟු බෝග සඳහා පළිබෝධ පාලන වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.
- ක්ෂේත්‍ර ගවේෂණ හරහා බෝග එකතූන් සහ ඒවායේ ගේ වල් දර්ශයන් 315 ක් එකතු කරන ලද අතර පර්යේෂණ ආයතනවලින් බෝග වර්ගවල සාම්පල 283 ක් එකතු කරන ලදී. තවද, විදේශීය බෝග ජනක ප්ලාස්ම 68 ක් ලැබුණි. 2022 වර්ෂයේදී ජාන බැංකුව තුළ සම්පූර්ණ එකතූන් 385 ක් සංරක්ෂණය කරන ලද අතර 2022 වසර අවසාන වන විට ජාන බැංකුවේ මුළු එකතුව 16,882 ක් ලෙස සංරක්ෂණය කර ඇත.
- බතල 109ක්, අර්තාපල් 25ක්, ඩයොස්කෝරියා 205ක්, ඉන්නල 28 ක් සහ කෙසෙල් සාම්පල 21ක් ඇතුළුව, මන්දගාමී වර්ධන මාධ්‍යයක් තුළ සාම්පල 388ක් නලස්ථව සංරක්ෂණය කරන ලදී.
- විවිධ බෝග විශේෂ 704ක්, ජනක ප්ලාස්ම භාවිතයට ගැනීම සඳහා පර්යේෂණ විද්‍යාඥයින්, ගොවීන් සහ විශ්ව විද්‍යාල අතර ඔවුන්ගේ ඉල්ලීම මත බෙදා දෙන ලදී.
- කොළඹ වරායේ නිරෝධායන කටයුතු වඩා පරිපූර්ණ ලෙස සිදු කිරීම සඳහා කොරියානු රජයේ ආධාර යටතේ ලද නව තෙමහල් ගොඩනැගිල්ල සඳහා 2022.07.19 වන දින මුල්ගල තැබූ අතර ඉදිකිරීම් කටයුතු සිදු කෙරෙමින් පවතී.
- කොළඹ ජාත්‍යන්තර ගුවන්තොටුපල (රත්මලාන) සඳහා දීර්ඝකාලීන අවශ්‍යතාවයක්ව පැවති නව ශාක නිරෝධායන ඒකකයක් 2022.03.27 වන දින ස්ථාපිත කරන ලදී.
- තැපැල් මගින් ශාක හා ශාක ද්‍රව්‍ය හුවමාරු කිරීමේදී ඇති විය හැකි පළිබෝධ අවදානම අවම කිරීම සඳහා කොළඹ මධ්‍යම තැපැල් හුවමාරුවේ ශාක නිරෝධායන කටයුතු

වෙනුවෙන් පහසුකම් සැලසීම පිණිස යාපනය, ගාල්ල, ත්‍රිකුණාමලය සහ මහනුවර ප්‍රදේශවල ශාක නිරෝධායන ඒකක පිහිටුවීමේ මූලික කටයුතු ආරම්භ කර තිබේ.

- යුරෝපා සංගමයේ රටවල් 27 සඳහා *Xylella fastidiosa* (නිරෝධායන ව්‍යාධිකාරකයක්) හි ධාරක ශාක අපනයනය කිරීමේ සීමාවන් ඉවත් කරවා ගැනීම සඳහා දීප ව්‍යාප්ත සමීක්ෂණයක් සිදු කර විශ්ලේෂණ වාර්තා සකස් කරන ලදී.
- KOICA ව්‍යාපෘතිය යටතේ ශාක නිරෝධායන සේවා ස්වයංක්‍රීයකරණය ආරම්භ කර තිබේ.
- යුරෝපීය සංගමයේ සහ ජාත්‍යන්තර වෙළඳ මධ්‍යස්ථානයේ සහාය ඇතිව ශාක ස්වස්ථතා ක්‍රියාකාරකම් සඳහා භාවිතා කරන ඉල්ලුම් පත්‍ර සහ ආකෘති සරල කිරීම සහ නවීකරණය කිරීම අවසන් වෙමින් පවතී.
- KOICA ව්‍යාපෘති ආධාර යටතේ ශාක ස්වස්ථතා මෙහෙයුම් ප්‍රමිති (SOP) සකස් කිරීම අවසන් අදියරේ පවතී.
- UNIDO සහාය ඇතිව රසායනාගාර ප්‍රමිතිකරණ කටයුතු සිදු කෙරෙමින් පවතී.
- යුරෝපීය සංගමයේ සහ ජාත්‍යන්තර වෙළඳ මධ්‍යස්ථානයේ සහාය ඇතිව ශාක ස්වස්ථතා සේවා සඳහා අන්තර්ජාලය හරහා ගෙවීම් සිදුකිරීමේ ක්‍රමවේදයක් සකස්කිරීම සඳහා පියවර ගෙන ඇත.

අභියෝග

- යෙදවුම් පිරිවැය වැඩි වීම සහ ඉන්ධන ලබා ගැනීමේ ගැටළු හේතුවෙන් වගා පිරිවැය වැඩි වීම. එබැවින් වී සහ වෙනත් ක්ෂේත්‍ර බෝග වගාවන් ලාභ නොලබන තත්වයකට පත්ව තිබීම.
- 2021/22 මහ කන්නයේ සිට පොහොර ප්‍රතිපත්තිය වෙනස් කිරීම හේතුවෙන් ශ්‍රී ලංකාවේ වී වගාවේ සාමාන්‍ය අස්වැන්න අඩුවීමේ ප්‍රවණතාවක් පැවතීම.
- නිසි මිලක් නොමැතිකම සහ අඩු අස්වැන්න හේතුවෙන් ආහාර සුරක්ෂිතතාවයට බරපතල අභියෝගයක් වන ලෙස ගොවීන් වී වගාවෙන් බැහැර වීමේ ප්‍රවණතාවක් පැවතීම.
- ප්‍රමාණයෙන් කුඩා හා විසිරී පවතින ගොවිබිම් හේතුවෙන් යාන්ත්‍රීකරණයේ දුෂ්කරතා ඇති කිරීම.
- කෘෂිකාර්මික ද්‍රව්‍ය අක්‍රමවත් ක්‍රම ඔස්සේ රට තුළට ඇතුළු වීම හේතුවෙන් නව ක්ෂුද්‍ර ජීවීන් (රෝගකාරක) රට තුළ පැතිරීම.
- වෙනත් ක්ෂේත්‍ර බෝග සඳහා ප්‍රමාණවත් සැකසුම් පහසුකම් සහ කෘෂි පාදක කර්මාන්ත නොමැති වීම.
- කෘෂිකාර්මික බෝග වලට වන සතුන් සිදු කරන හානි.

- ව්‍යාප්ති සේවාව පළාත් සභාව සහ මධ්‍යම ආණ්ඩුව යන වෙනම ස්වාධීන අධිකාරීන් දෙකක් යටතේ ක්‍රියාත්මක වීම හේතුවෙන් අදාළ තාක්ෂණයන් ගොවීන් වෙත සෘජුවම බෙදා හැරීමේ ගැටලු මතුව තිබීම.
- පරිභෝජනයට ගන්නා වී සඳහා වෙළඳපල මිල ඉහළ යාම හේතුවෙන් ගොවීන්ගෙන් කොන්ත්‍රාත් බීජ වී මිලදී ගැනීමේ අපහසුතාව.
- රටේ පවතින ආර්ථික තත්ත්වය සමග කෘෂිකාර්මික යෙදවුම්වල (කෘෂිරසායන, පොහොර ආදිය) හිඟකම හේතුවෙන් බීජ නිෂ්පාදකයින් බීජ නිෂ්පාදනය කිරීමට ඉදිරිපත් නොවීම.
- ක්ෂේත්‍ර මට්ටමේ නීති විරෝධී පළිබෝධනාශක සුලභ වීම.
- පවතින ආර්ථික තත්ත්වය යටතේ ආනයනික රසායන ද්‍රව්‍ය සහ ඇතැම් අවශ්‍ය පහසුකම් සඳහා සැපයුම්කරුවන් සොයා ගැනීමට අපහසු වීම සහ ඉහළ මිල ගණන් හේතුවෙන් රසායනාගාර විශ්ලේෂණ සිදුකිරීමේ අපහසුතාව.
35. ITEC- "කෘෂිකර්මය හා ග්‍රාමීය සංවර්ධනය ඇතුළත් මූල්‍යකරණය"	02	05.12.2022 16.12.2022			විදේශීය	කෘෂිකර්මාන්තය සඳහා මූල්‍ය පිළිබඳ දැනුම හුවමාරු කර ගැනීම
36. ජානික හරිතාගාර වායු විමෝචන ප්‍රමාණන ලැයිස්තුවේ පාංශු කාබන් සංචිත වෙනස්වීම් වාර්තා කිරීම පිළිබඳ තාක්ෂණික පුහුණුව	02	12.12.2022 16.12.2022			විදේශීය	හරිතාගාර වායු තුළ පාංශු කාබන් සංචිත වෙනස්වීම පිළිබඳ තාක්ෂණික පුහුණුව
37. CABI පිළිබඳ කලාපීය වැඩමුළුව - ඩිජිටල් මෙවලම් ඩිජිටල් ඉගෙනුම් නිෂ්පාදන සහ තීරණ ගැනීමේ මෙවලම්	01	23.12.2022 22.12.2022			විදේශීය	කෘෂිකර්මාන්තය සඳහා ඩිජිටල් මෙවලම් පිළිබඳ දැනුම
විදේශීය පුහුණු (මාර්ගගත)						
38. සත්ව ආහාර සහ ඉන්ධන සඳහා ජෛව ස්කන්ධ ඵලදායී ලෙස භාවිතා කිරීම	02	14.02.2022 18.02.2022			මාර්ග ගත	ජෛව ස්කන්ධ උපයෝගී කර ගැනීම පිළිබඳ දැනුම
39. පශු සම්පත් ප්‍රජනන තාක්ෂණයේ සංවර්ධනය	02	21.03.2022 31.03.2022			මාර්ග ගත	පශු සම්පත් ප්‍රජනන තාක්ෂණය පිළිබඳ දැනුම

වැඩසටහනේ නම	පුහුණු කළ සංඛ්‍යාව	වැඩසටහනේ කාලය	මුළු ආයෝජනය (රු.'000)		වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය)	නිමවුම/ ලබා ගත් දැනුම
			දේශීය	විදේශීය		
40. සංවර්ධනය වෙමින් පවතින රටවල් උදෙසා වෙළඳපල ප්‍රවේශය පිණිස ආහාර සුරක්ෂිතතා තත්ව යටිතල පහසුකම්	02	14.03.2022 25.03.2022			මාර්ග ගත	ආහාර සුරක්ෂිතතාව පිළිබඳ දැනුම
41. කෘෂිකර්මය සහ ආහාර සැපයුම් දාම කළමනාකරණය සම්බන්ධ කරුණු පිළිබඳ අන්තර්ජාල වැඩමුළුව	01	09.03.2022 11.03.2022			මාර්ග ගත	ආහාර සැපයුම් දාම කළමනාකරණය සඳහා අන්තර්ජාලය පිළිබඳ දැනුම
42. දිල්ලි ඒකාබද්ධ මාර්ගගත පුහුණු වැඩසටහන - අප්‍රිකානු - ආසියානු රටවල කෘෂි ආහාර දාමයේ නැනෝ විෂ වීම	02	07.02.2022 11.02.2022			මාර්ග ගත	කෘෂි ආහාර දාමයේ නැනෝ විෂ වීම පිළිබඳ දැනුම
43. AARDO-MARDI ඒකාබද්ධ මාර්ගගත පුහුණු වැඩසටහන: ඔරොත්තු දෙන කෘෂිකර්මාන්තය සාක්ෂාත් කර ගැනීම සඳහා නිරෝගී පාංශු ශාක අන්තර් ක්‍රියාකාරකම්වල කාර්යභාරය	01	21.02.2022 03.03.2022			මාර්ග ගත	නිරෝගී පාංශු ශාක අන්තර් ක්‍රියාකාරකම් පිළිබඳ දැනුම
44. සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා ධාරිතා වර්ධනය - රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ සම්මන්ත්‍රණය	05	23.03.2022 31.03.2022			මාර්ග ගත	රාජ්‍ය නොවන සංවිධාන ධාරිතා වර්ධනය පිළිබඳ දැනුම හුවමාරු කර ගැනීම
45. සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා පාරිසරික කෘෂිකාර්මික කළමනාකරණ හැකියාවන් වැඩි දියුණු කිරීම පිළිබඳ සම්මන්ත්‍රණය	01	13.04.2022 26.04.2022			මාර්ග ගත	පාරිසරික කෘෂිකාර්මික කළමනාකරණ පිළිබඳ දැනුම හුවමාරු කර ගැනීම
46. සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා ආහාරයට ගැනීමට යෝග්‍ය බිම්මල් තාක්ෂණය පිළිබඳ සම්මන්ත්‍රණය	03	07.04.2022 27.04.2022			මාර්ග ගත	ආහාරයට ගැනීමට යෝග්‍ය බිම්මල් තාක්ෂණය පිළිබඳ දැනුම හුවමාරු කර ගැනීම

වැඩසටහනේ නම	පුහුණු කළ සංඛ්‍යාව	වැඩසටහනේ කාලය	මුළු ආයෝජනය (රු.'000)		වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය)	නිමවුම/ ලබා ගත් දැනුම
			දේශීය	විදේශීය		
47. කෘෂිකාර්මික බෝගවල වටිනාකම් දාමයේ පසු අස්වනු හානිය වැළැක්වීම	01	04.07.2022 08.07.2022			මාර්ග ගත	පසු අස්වනු හානි වැළැක්වීම පිළිබඳ දැනුම හුවමාරු කර ගැනීම
48. සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා ධාන්‍ය සහ ආකන්ද බෝග සැකසුම් තාක්ෂණය පිළිබඳ පුහුණු පාඨමාලාව	02	07.04.2022 27.04.2022			මාර්ග ගත	ධාන්‍ය සහ ආකන්ද බෝග සැකසීම පිළිබඳ දැනුම හුවමාරු කර ගැනීම
49. MTCP: සයිබර් ආරක්ෂාව මගින් සහතික විනිවිතා පරීක්ෂණ	02	17 -20 මැයි 2022 23 - 24 මැයි 2022			මාර්ග ගත	සයිබර් ආරක්ෂාව පිළිබඳ දැනුම
50. තිරසාර සංවර්ධනය සඳහා දේශගුණික විපර්යාස අනුවර්තන මාර්ග	03	02.05.2022 13.05.2022			මාර්ග ගත	දේශගුණික විපර්යාස අනුවර්තන පිළිබඳ දැනුම
51. 3 වන ගෝලීය අපද්‍රව්‍ය කළමනාකරණ සමුළුව 2.022	02	29.03.2022 30.03.2022			මාර්ග ගත	අපද්‍රව්‍ය කළමනාකරණ පිළිබඳ දැනුම හුවමාරු කර ගැනීම
52. සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා කර්මාන්ත හරිත සංවර්ධනය පිළිබඳ ප්‍රතිපත්ති සහ භාවිතයන් පිළිබඳ සම්මන්ත්‍රණය	01	15.04.2022 28.04.2022			මාර්ග ගත	කර්මාන්ත හරිත සංවර්ධනය පිළිබඳ ප්‍රතිපත්ති සහ භාවිතයන් පිළිබඳ දැනුම හුවමාරු කර ගැනීම
53. සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා යාන්ත්‍රික සහ ඉලෙක්ට්‍රොනික කර්මාන්ත ප්‍රවර්ධනය සහ ආර්ථික සංවර්ධනය පිළිබඳ සම්මන්ත්‍රණය	02	15.04.2022 28.04.2022			මාර්ග ගත	යාන්ත්‍රික සහ ඉලෙක්ට්‍රොනික කර්මාන්ත ප්‍රවර්ධනය පිළිබඳ දැනුම හුවමාරු කර ගැනීම
54. සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා දෙමුහුන් සහල් විස්තීර්ණ තාක්ෂණය පිළිබඳ පුහුණු පාඨමාලාව	01	12.04.2022 11.05.2022			මාර්ග ගත	දෙමුහුන් සහල් විස්තීර්ණ තාක්ෂණය පිළිබඳ දැනුම හුවමාරු කර ගැනීම

වැඩසටහනේ නම	පුහුණු කළ සංඛ්‍යාව	වැඩසටහනේ කාලය	මුළු ආයෝජනය (රු.'000)		වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය)	නිමවුම/ ලබා ගත් දැනුම
			දේශීය	විදේශීය		
55. සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා කෘෂිකාර්මික අපද්‍රව්‍ය උපයෝගී කර ගැනීම සම්බන්ධයෙන් ජීව වායු තාක්ෂණය පිළිබඳ පුහුණු පාඨමාලාව	02	06.04.2022 05.05.2022			මාර්ග ගත	ඒකාබද්ධ ස්වභාවික සම්පත් කළමනාකරණය පිළිබඳ දැනුම හුවමාරු කර ගැනීම
56. කෘෂිකාර්මික භෝග වල වටිනාකම් දාමයේ පසු අස්වනු හානි වැළැක්වීම	02	04.07.2022 08.07.2022			මාර්ග ගත	අස්වනු හානි වැළැක්වීම පිළිබඳ දැනුම
57. තීරය සහ මාර්ග (Belt & road) ආරම්භකයේ රටවල් සඳහා කෘෂිකාර්මික සංවර්ධන සැලසුම් පිළිබඳ සම්මන්ත්‍රණය	02	12.04.2022 25.04.2022			මාර්ග ගත	තීරය සහ මාර්ග ආරම්භකයේ රටවල් සඳහා කෘෂිකාර්මික සංවර්ධන සැලසුම් පිළිබඳ දැනුම හුවමාරු කර ගැනීම
58. බලපෑම් පුරෝකථනය සහ අවදානම් විශ්ලේෂණය පිළිබඳ පුහුණුව (UNESCAP අදියර)	03	18.04.2022 21.04.2022			මාර්ග ගත	බලපෑම් පුරෝකථනය සහ අවදානම් විශ්ලේෂණය පිළිබඳ දැනුම
59. ආසියා පැසිෆික් කෘෂිකාර්මික පර්යේෂණ ආයතනය (APAARI) විසින් අරමුදල් සපයන ව්‍යාපෘතිය යටතේ පවත්වන ලද ජෛව පළිබෝධනාශක වැඩමුළුව	08	19.04.2022 20.04.2022			මාර්ග ගත	ජෛව පළිබෝධනාශක පිළිබඳ දැනුම
60. කෘෂිකාර්මික රක්ෂණය සහ ගොවිපල අවදානම් කළමනාකරණය පිළිබඳ සමුළුව	01	15.06.2022			මාර්ග ගත	කෘෂිකාර්මික රක්ෂණය සහ ගොවිපල අවදානම් කළමනාකරණය පිළිබඳ දැනුම හුවමාරු කර ගැනීම
61. ශාක ස්වසථතා මිණුම් පිළිබඳ කොමිසමේ 16 වන සැසිවාරය	01	5,7& 21 April 2022			මාර්ග ගත	ශාක ස්වසථතා මිණුම් පිළිබඳ දැනුම හුවමාරු කර ගැනීම

වැඩසටහනේ නම	පුහුණු කළ සංඛ්‍යාව	වැඩසටහනේ කාලය	මුළු ආයෝජනය (රු.'000)		වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය)	නිමවුම/ ලබා ගත් දැනුම
			දේශීය	විදේශීය		
62. ආසියා - පැසිෆික් කලාපීය උපදේශනය	01	13.04.2022			මාර්ග ගත	ආසියා - පැසිෆික් කලාපීය කෘෂිකර්මය පිළිබඳ දැනුම හුවමාරු කර ගැනීම
63. සමාජ ජාල සහ තිරසාර ආර්ථික සංවර්ධනය පිළිබඳ ජාත්‍යන්තර පුහුණු වැඩසටහන	04	16.05.2022 20.05.2022			මාර්ග ගත	සමාජ ජාල සහ තිරසාර ආර්ථික සංවර්ධනය පිළිබඳ දැනුම
64. කුඩා පරිමාණ ගොවීන් සඳහා ඉක්මණින් නරක් වනසුලු නිෂ්පාදන සඳහා වන සැපයුම් දාමයේ නවෝත්පාදන තාක්ෂණය පිළිබඳ වැඩමුළුව	01	24.05.2022 26.05.2022			මාර්ග ගත	ඉක්මණින් නරක් වනසුලු නිෂ්පාදන සඳහා වන සැපයුම් දාමයේ නවෝත්පාදන තාක්ෂණය පිළිබඳ දැනුම
65. සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා නව ශාක ප්‍රභේද ආරක්ෂා කිරීම පිළිබඳ සම්මන්ත්‍රණය	01	24.05.2022 01.06.2022			මාර්ග ගත	නව ශාක ප්‍රභේද ආරක්ෂා කිරීම පිළිබඳ දැනුම හුවමාරු කර ගැනීම
66. ආහාර සහ කෘෂිකර්මාන්තය සඳහා වන ශාක ජාන සම්පත් පිළිබඳ ජාත්‍යන්තර ගිවිසුමේ පාලක මණ්ඩලයේ 9 වැනි සැසිය	01	19.09.2022 24.09.2022			මාර්ග ගත	ආහාර සහ කෘෂිකර්මාන්තය සඳහා වන ශාක ජාන සම්පත් පිළිබඳ දැනුම හුවමාරු කර ගැනීම
67. තිරසාර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීමේදී විද්‍යාව, තාක්ෂණය සහ නවෝත්පාදනයේ (STI) භූමිකාව පිළිබඳ ජාත්‍යන්තර අතථ්‍ය වැඩමුළුව - 2030	01	24.05.2022 25.05.2022			මාර්ග ගත	තිරසාරත්වය සාක්ෂාත් කර ගැනීමේදී විද්‍යාව, තාක්ෂණය සහ නවෝත්පාදනය (STI) පිළිබඳ දැනුම
68. ආසියානු රටවල් සඳහා JICA KCCP වෙළඳපල ඉලක්ක කරගත් කෘෂිකර්ම ප්‍රවර්ධනය (සැලසුම් සහ කළමනාකරණය) "A"	01	22.08.2022 26.08.2022 & 05.09.2022 - 09.09.2022			මාර්ග ගත	වෙළඳපල ඉලක්ක කරගත් කෘෂිකර්ම ප්‍රවර්ධනය පිළිබඳ දැනුම
69. සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා ජීව වායු තාක්ෂණය ග්‍රාමීය බලශක්ති සහ පාරිසරික ආරක්ෂාව පිළිබඳ පුහුණු පාඨමාලාව	01	07.06.2022 06.07.2022			මාර්ග ගත	ජීව වායු තාක්ෂණය, ග්‍රාමීය බලශක්තිය සහ පාරිසරික ආරක්ෂාව පිළිබඳ දැනුම

වැඩසටහනේ නම	පුහුණු කළ සංඛ්‍යාව	වැඩසටහනේ කාලය	මුළු ආයෝජනය (රු.'000)		වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය)	නිමවුම/ ලබා ගත් දැනුම
			දේශීය	විදේශීය		
70. සංවර්ධනය වෙමින් පවතින රටවල හරිතාගාර එළවළු වගා තාක්ෂණය පිළිබඳ සම්මන්ත්‍රණය	01	07.06.2022 27.06.2022			මාර්ග ගත	හරිතාගාර එළවළු වගා තාක්ෂණය පිළිබඳ දැනුම
71. කෘෂිකාර්මික තාක්ෂණ ව්‍යාප්ති ක්‍රමවේද නිර්මාණය සහ කළමනාකරණය පිළිබඳ සම්මන්ත්‍රණය	02	22.06.2022 28.06.2022			මාර්ග ගත	කෘෂිකාර්මික තාක්ෂණ ව්‍යාප්ති ක්‍රමවේද පිළිබඳ දැනුම හුවමාරු කර ගැනීම
72. සංවර්ධනය වෙමින් පවතින රටවල නිලධාරීන් සඳහා ග්‍රාමීය සංවර්ධනය සහ දරිද්‍රතාවය පිටුදැකීම පිළිබඳ සම්මන්ත්‍රණය	02	05.07.2022 14.07.2022			මාර්ග ගත	ග්‍රාමීය සංවර්ධනය සහ දරිද්‍රතාවය පිටුදැකීම පිළිබඳ දැනුම හුවමාරු කර ගැනීම
73. චීනයේ හරිත සංවර්ධන පිළිවෙත් පිළිබඳ සම්මන්ත්‍රණය	02	21.06.2022 04.07.2022			මාර්ග ගත	හරිත සංවර්ධන පිළිවෙත් පිළිබඳ දැනුම හුවමාරු කර ගැනීම
74. සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා තෙල් බෝග සම්බන්ධ විස්තීරණ තාක්ෂණය පිළිබඳ පුහුණු පාඨමාලාව	01	28.06.2022 18.07.2022			මාර්ග ගත	තෙල් බෝග පිළිබඳ පුහුණුව
75. සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා මී මැසි පාලක සමුපකාර නිෂ්පාදන කළමනාකරණය පිළිබඳ පුහුණු පාඨමාලාව	03	28.06.2022 18.07.2022			මාර්ග ගත	මී මැසි පාලක සමුපකාර නිෂ්පාදන කළමනාකරණය පිළිබඳ දැනුම
76. සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා දෙමුහුන් බඩ ඉරිඟු විස්තීරණ තාක්ෂණය පිළිබඳ පුහුණු පාඨමාලාව	02	23.06.2022 20.07.2022			මාර්ග ගත	දෙමුහුන් බඩ ඉරිඟු විස්තීරණ තාක්ෂණය පිළිබඳ දැනුම
77. අන්තර්ජාලය හරහා සත්කාරක සේවා සැපයීම තුළින් සේවා අංශයේ ඵලදායිතාව ඉහළ නැංවීම පිළිබඳ වැඩමුළුව	03	24.08.2022 26.08.2022			මාර්ග ගත	සේවා අංශයේ ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා අන්තර්ජාලය හරහා සත්කාරක සේවා සැපයීම පිළිබඳ දැනුම

වැඩසටහනේ නම	පුහුණු කළ සංඛ්‍යාව	වැඩසටහනේ කාලය	මුළු ආයෝජනය (රු.'000)		වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය)	නිමවුම/ ලබා ගත් දැනුම
			දේශීය	විදේශීය		
78. 22-CP-17-GE-TRC-A: ආහාර සුරක්ෂිතතා කළමනාකරණ පද්ධති පිළිබඳ උසස් පුහුණු පාඨමාලාව	01	05.09.2022 08.09.2022			මාර්ග ගත	ආහාර සුරක්ෂිතතා කළමනාකරණ පද්ධති පිළිබඳ දැනුම
79. කෘෂි ආහාර පරිණාමය පිළිබඳ සම්මන්ත්‍රණය	01	31.08.2022			මාර්ග ගත	කෘෂි ආහාර පරිණාමය පිළිබඳ දැනුම හුවමාරු කර ගැනීම
80. 22-CP-44-GE-TRC-A: රාජ්‍ය අංශයේ ඵලදායිතා විශේෂඥයින් සංවර්ධනය	01	16.05.2022 20.05.2022			මාර්ග ගත	රාජ්‍ය අංශයේ ඵලදායිතාවය පිළිබඳ දැනුම හුවමාරු කර ගැනීම
81. CORIGAP විද්‍යා සම්මන්ත්‍රණය සහ CORIGAP උගත් පාඩම් සම්මන්ත්‍රණය Agri technica Asia live 2022 – තිරසාර කෘෂිකර්මාන්තය සඳහා සමකාලීන යාන්ත්‍රිකකරණය	01	24.08.2022 26.08.2022			මාර්ග ගත	තිරසාර කෘෂිකර්මාන්තය සඳහා කෘෂි තාක්ෂණය පිළිබඳ දැනුම හුවමාරු කර ගැනීම
82. ශ්‍රීලංක සාමාන්‍ය ආහාර කර්මාන්තයට ආහාර විද්‍යාව සහ තාක්ෂණයේ දායකත්වය	02	09-10, 16-17, 23-24 June 2022			මාර්ග ගත	ආහාර විද්‍යාව සහ තාක්ෂණය පිළිබඳ දැනුම හුවමාරු කර ගැනීම
83. කෘෂි ආහාර කර්මාන්ත වැඩිදියුණු කිරීම සඳහා සුහුරු තිරසාර තක්සේරු මෙවලම් සහ ශිල්පීය ක්‍රම පිළිබඳ පුහුණු පාඨමාලාව	හ	12.07.2022 15.07.2022			මාර්ග ගත	සුහුරු තිරසාර තක්සේරු මෙවලම් සහ ශිල්පීය ක්‍රම පිළිබඳ දැනුම
84. සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා තොරතුරු තාක්ෂණ භාවිතය පිළිබඳ සම්මන්ත්‍රණය	05	10.08.2022 30.08.2022			මාර්ග ගත	තොරතුරු තාක්ෂණ යොදා ගැනීම පිළිබඳ දැනුම
85. සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා නව එළවළු ප්‍රභේද සහ වගා තාක්ෂණයන් ප්‍රදර්ශනය කිරීම සහ ප්‍රවර්ධනය කිරීම පිළිබඳ සම්මන්ත්‍රණය	04	26.07.2022 14.08.2022			මාර්ග ගත	නව එළවළු ප්‍රභේද සහ වගා තාක්ෂණයන් ප්‍රදර්ශනය කිරීම සහ ප්‍රවර්ධනය කිරීම පිළිබඳ දැනුම

වැඩසටහනේ නම	පුහුණු කළ සංඛ්‍යාව	වැඩසටහනේ කාලය	මුළු ආයෝජනය (රු.'000)		වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය)	නිමවුම/ ලබා ගත් දැනුම
			දේශීය	විදේශීය		
86. සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා සෝයා බෝංචි නිෂ්පාදනය සහ සැකසීම සහ ආයතනික හැකියා වර්ධනය පිළිබඳ සම්මන්ත්‍රණය	01	21.07.2022 10.08.2022			මාර්ග ගත	සෝයා බෝංචි නිෂ්පාදනය සහ සැකසීම සහ ආයතනික ධාරිතාව ගොඩනැගීම පිළිබඳ දැනුම
87. සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා වී සහ ජලජීවී වගාව පිළිබඳ පුහුණු පාඨමාලාව	01	27.07.2022 16.08.2022			මාර්ග ගත	හරිත සුපිරි දෙමුහුන් සහල් ප්‍රභේදය සහ ජලජීවී වගාව පිළිබඳ දැනුම
88. සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා මී මැසි නිෂ්පාදනය සහ ධාන්‍ය සහ තෙල් සහිත භෝග ඉහළ නැංවීමේ විස්තීරණ තාක්ෂණය පිළිබඳ පුහුණු පාඨමාලාව	01	21.07.2022 10.08.2022			මාර්ග ගත	මී මැසි නිෂ්පාදනය සහ ධාන්‍ය සහ තෙල් සහිත භෝග ඉහළ නැංවීමේ විස්තීරණ තාක්ෂණය පිළිබඳ දැනුම
89. සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා කුඩා කෘෂිකාර්මික යන්ත්‍රෝපකරණවල ප්‍රායෝගික තාක්ෂණය පිළිබඳ පුහුණු පාඨමාලාව	02	19.07.2022 17.08.2022			මාර්ග ගත	කුඩා කෘෂිකාර්මික යන්ත්‍රෝපකරණවල ප්‍රායෝගික තාක්ෂණය පිළිබඳ දැනුම
90. සංවර්ධනය වෙමින් පවතින රටවල නිලධාරීන් සඳහා කෘෂිකාර්මික දකුණු-දකුණු සහයෝගීතාව පිළිබඳ සම්මන්ත්‍රණය	01	20.07.2022 26.07.2022			මාර්ග ගත	කෘෂිකාර්මික දකුණු-දකුණු සහයෝගීතාව පිළිබඳ දැනුම
91. සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා ජෛව ස්කන්ධ බලශක්තිය වැඩිදියුණු කිරීම සහ භාවිතය පිළිබඳ සම්මන්ත්‍රණය	01	21.07.2022 18.08.2022			මාර්ග ගත	ජෛව ස්කන්ධ බලශක්තිය වැඩිදියුණු කිරීම සහ භාවිතය පිළිබඳ දැනුම
92. සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා නිවර්තන කෘෂිකර්මාන්තයේ නව තාක්ෂණය පිළිබඳ පුහුණු පාඨමාලාව	01	11.08.2022 31.08.2022			මාර්ග ගත	නිවර්තන කෘෂිකර්මාන්තයේ නව තාක්ෂණය පිළිබඳ දැනුම
93. තිරය සහ මාර්ග (Belt & road) ආරම්භකයේ රටවල කාන්තාවන් සඳහා ආහාරයට ගත හැකි බිම්මල් වගා තාක්ෂණය පිළිබඳ වැඩමුළුව	02	18.08.2022 07.09.2022			මාර්ග ගත	ආහාරයට ගත හැකි බිම්මල් වගා තාක්ෂණය පිළිබඳ දැනුම

වැඩසටහනේ නම	පුහුණු කළ සංඛ්‍යාව	වැඩසටහනේ කාලය	මුළු ආයෝජනය (රු.'000)		වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය)	නිමවුම/ ලබා ගත් දැනුම
			දේශීය	විදේශීය		
94. සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා නිවර්තන බෝගවල ඒකාබද්ධ පළිබෝධ කළමනාකරණය පිළිබඳ පුහුණු පාඨමාලාව	01	11.08.2022 31.08.2022			මාර්ග ගත	නිවර්තන බෝගවල ඒකාබද්ධ පළිබෝධ කළමනාකරණය පිළිබඳ දැනුම
95. SCO නවීන කෘෂිකර්ම සංවර්ධන වටමේස	01	15.09.2022			මාර්ග ගත	නවීන කෘෂිකර්ම සංවර්ධනය පිළිබඳ දැනුම හුවමාරු කර ගැනීම
96. ග්‍රාමීය සංචාරක කර්මාන්තය සඳහා නව්‍ය ව්‍යාපාරික ආකෘති පිළිබඳ වැඩමුළුව	02	12.10.2022 14.10.2022			මාර්ග ගත	ග්‍රාමීය සංචාරක කර්මාන්තය සඳහා නව්‍ය ව්‍යාපාරික ආකෘති පිළිබඳ දැනුම
97. වනාන්තර සහ ස්වාභාවික සම්පත් තිරසාර ලෙස භාවිතා කිරීම සහ වටිනාකම් දාමය දේශීය වශයෙන් ශක්තිමත් කිරීම	02	31.10.2022 02.12.2022			මාර්ග ගත	වනාන්තර සහ ස්වාභාවික සම්පත් තිරසාර ලෙස භාවිතා කිරීම සහ වටිනාකම් දාමය දේශීය වශයෙන් ශක්තිමත් කිරීම පිළිබඳ දැනුම හුවමාරු කර ගැනීම
98. ඵලදායිතාව සහ ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා ශාක රෝග සහ පළිබෝධ කළමනාකරණය පිළිබඳ නව්‍ය සංකල්ප පිළිබඳ පුහුණු වැඩසටහන	03	11.10.2022 14.10.2022			මාර්ග ගත	ශාක රෝග සහ පළිබෝධ කළමනාකරණය පිළිබඳ නව්‍ය සංකල්ප පිළිබඳ දැනුම
99. ක්ෂුද්‍ර ජීවී ජෛව පළිබෝධනාශක නිෂ්පාදන වැඩමුළුව	01	24.10.2022 31.10.2022			මාර්ග ගත	ක්ෂුද්‍ර ජීවී ජෛව පළිබෝධනාශක නිෂ්පාදනය පිළිබඳ දැනුම
100. BRI රටවල් සඳහා කෘෂිකාර්මික තොරතුරු සේවා කළමනාකරණය පිළිබඳ TA/CHI/S/422 සම්මන්ත්‍රණය	03	12.10.2022 25.10.2022			මාර්ග ගත	කෘෂිකාර්මික තොරතුරු සේවා කළමනාකරණය පිළිබඳ දැනුම

වැඩසටහනේ නම	පුහුණු කළ සංඛ්‍යාව	වැඩසටහනේ කාලය	මුළු ආයෝජනය (රු.'000)		වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය)	නිමවුම/ ලබා ගත් දැනුම
			දේශීය	විදේශීය		
101. සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා අපනයනය කළ හැකි කෘෂිකාර්මික නිෂ්පාදනවල ආරක්ෂාව සහ තත්ත්ව කළමනාකරණය පිළිබඳ TA/CHI/S/442 සම්මන්ත්‍රණය	09	13.10.2022 02.11.2022			මාර්ග ගත	අපනයනය කළ හැකි කෘෂිකාර්මික නිෂ්පාදනවල ආරක්ෂාව සහ තත්ත්ව කළමනාකරණය පිළිබඳ දැනුම
102. හරිත පාරිසරික සහ ආරක්ෂිත ධාන්‍ය ගබඩා කිරීමේ තාක්ෂණය පිළිබඳ TA/CHI/S/444 පුහුණු පාඨමාලාව	01	18.10.2022 27.10.2022			මාර්ග ගත	හරිත පාරිසරික සහ ආරක්ෂිත ධාන්‍ය ගබඩා කිරීමේ තාක්ෂණය පිළිබඳ දැනුම
103. තීරය සහ මාර්ග (Belt & road) ආරම්භකයේ රටවල් සඳහා ආහාර සුරක්ෂිතතා කළමනාකරණය පිළිබඳ TA/CHI/S/445 සම්මන්ත්‍රණය	02	18.10.2022 07.11.2022			මාර්ග ගත	ආහාර සුරක්ෂිතතා කළමනාකරණය පිළිබඳ දැනුම
104. සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා ධාන්‍ය ගබඩා කිරීම පිළිබඳ TA/CHI/S/446 සම්මන්ත්‍රණය	05	18.10.2022 07.11.2022			මාර්ග ගත	ධාන්‍ය ගබඩා කිරීම පිළිබඳ දැනුම
105.සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා පස සහ පොහොර විස්තීර්ණ කළමනාකරණය සහ භාවිතය පිළිබඳ TA/CHI/S/457 සම්මන්ත්‍රණය	05	24.10.2022 06.11.2022			මාර්ග ගත	පස සහ පොහොර විස්තීර්ණ කළමනාකරණය සහ භාවිතය පිළිබඳ දැනුම
106.සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා බෝග බීජ නිෂ්පාදනය සහ කළමනාකරණය පිළිබඳ TA/CHI/S/396 සම්මන්ත්‍රණය	01	10.10.2022 23.10.2022			මාර්ග ගත	සඳහා බෝග බීජ නිෂ්පාදනය සහ කළමනාකරණය පිළිබඳ දැනුම
107. තීරය සහ මාර්ග (Belt & road) ආරම්භකයේ රටවල් සඳහා කෘෂිකාර්මික නිෂ්පාදන බෙදා හැරීම සහ වෙළඳාම පිළිබඳ TA/CHI/S/397 සම්මන්ත්‍රණය	04	10.10.2022 – 30.10.2022			මාර්ග ගත	කෘෂිකාර්මික නිෂ්පාදන බෙදා හැරීම සහ වෙළඳාම පිළිබඳ දැනුම

වැඩසටහනේ නම	පුහුණු කළ සංඛ්‍යාව	වැඩසටහනේ කාලය	මුළු ආයෝජනය (රු.'000)		වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය)	නිමවුම/ ලබා ගත් දැනුම
			දේශීය	විදේශීය		
108.සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා ගොවිපල නිෂ්පාදන සංසරණ තාක්ෂණය පිළිබඳ TA/CHI/S/410 සම්මන්ත්‍රණය	01	11.10.2022 – 31.10.2022			මාර්ග ගත	ගොවිපල නිෂ්පාදන සංසරණ තාක්ෂණය පිළිබඳ දැනුම
109. සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා පරිසර හිතකාමී පොහොර නිෂ්පාදනය, යොදා ගැනීම සහ ප්‍රදර්ශනය කිරීම පිළිබඳ TA/CHI/S/413 සම්මන්ත්‍රණය	07	11.10.2022 – 31.10.2022			මාර්ග ගත	පරිසර හිතකාමී පොහොර නිෂ්පාදනය, යොදා ගැනීම සහ ප්‍රදර්ශනය කිරීම පිළිබඳ දැනුම
110. තීරය සහ මාර්ග (Belt & road) ආරම්භකයේ රටවල් සඳහා පරිසර හිතකාමී කෘෂිකර්මය ප්‍රතිවක්‍රීකරණය කිරීම පිළිබඳ TA/CHI/S/414 සම්මන්ත්‍රණය	01	11.10.2022 – 31.10.2022			මාර්ග ගත	පරිසර හිතකාමී කෘෂිකර්මය ප්‍රතිවක්‍රීකරණය කිරීම පිළිබඳ දැනුම
111.තිරසාර කෘෂිකාර්මික සංවර්ධනය සහ සුහුරු කෘෂිකර්මය පිළිබඳ TA/CHI/S/415 සම්මන්ත්‍රණය	10	11.10.2022 – 31.10.2022			මාර්ග ගත	තිරසාර කෘෂිකාර්මික සංවර්ධනය සහ සුහුරු කෘෂිකර්මය පිළිබඳ දැනුම
112.සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා නිවර්තන ජෛව සම්පත් සංවර්ධනය හා භාවිතය පිළිබඳ TA/CHI/S/416 පුහුණු පාඨමාලාව	01	11.10.2022 – 31.10.2022			මාර්ග ගත	නිවර්තන ජෛව සම්පත් සංවර්ධනය හා භාවිතය පිළිබඳ දැනුම
113.සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා සමස්ත කෘෂිකාර්මික කර්මාන්ත දාමය ගොඩනැගීම පිළිබඳ TA/CHI/S/458 සම්මන්ත්‍රණය	07	24.10.2022 - 13.11.2022			මාර්ග ගත	සමස්ත කෘෂිකාර්මික කර්මාන්ත දාමය ගොඩනැගීම පිළිබඳ දැනුම
114. සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා කෘෂිකාර්මික නිෂ්පාදන පරිසරය නියාමනය කිරීම පිළිබඳ TA/CHI/S/460 සම්මන්ත්‍රණය	02	25.10.2022 03.11.2022			මාර්ග ගත	කෘෂිකාර්මික නිෂ්පාදන පරිසරය නියාමනය කිරීම පිළිබඳ දැනුම
115. සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා කෘෂිකර්මාන්තය සහ පශු සම්පත් නිෂ්පාදන සැකසීම සහ සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා ආයතනික ධාරිතාව ගොඩනැගීම පිළිබඳ TA/CHI/S/465 සම්මන්ත්‍රණය	03	26.10.2022 15.11.2022			මාර්ග ගත	කෘෂිකර්මාන්තය සහ පශු සම්පත් නිෂ්පාදන සැකසීම සහ හා ආයතනික ධාරිතාව ගොඩනැගීම පිළිබඳ දැනුම

වැඩසටහනේ නම	පුහුණු කළ සංඛ්‍යාව	වැඩසටහනේ කාලය	මුළු ආයෝජනය (රු.'000)		වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය)	නිමවුම/ ලබා ගත් දැනුම
			දේශීය	විදේශීය		
116. චීනයේ FAO ශ්‍රී ලංකා දකුණු-දකුණු සහයෝගිතා ව්‍යාපෘතිය යටතේ නිවර්තන පළතුරු නිෂ්පාදන තාක්ෂණය සහ කර්මාන්ත සංවර්ධනය පිළිබඳ පුහුණු පාඨමාලාව	01	10.10.2022 14.10.2022			මාර්ග ගත	නිවර්තන පළතුරු නිෂ්පාදන තාක්ෂණය සහ කර්මාන්ත සංවර්ධනය පිළිබඳ දැනුම
117. ශ්‍රී ලංකාව සඳහා දරිද්‍රතාවය පිටුදැකීම සහ තිරසාර සංවර්ධනය පිළිබඳ සම්මන්ත්‍රණය	02	11.10.2022 24.10.2022			මාර්ග ගත	දරිද්‍රතාවය පිටුදැකීම සහ තිරසාර සංවර්ධනය පිළිබඳ දැනුම
118. කොරියාවේ සුහුරු ගොවිතැනේ වර්තමානය සහ අනාගතය	03	25.10.2022 26.10.2022			මාර්ග ගත	සුහුරු ගොවිතැන පිළිබඳ දැනුම
119. තිරය සහ මාර්ග (Belt & road) ආරම්භකයේ රටවල් සඳහා කෘෂිකාර්මික කාර්මික සංවර්ධනය පිළිබඳ සම්මන්ත්‍රණය	01	09.11.2022 29.11.2022			මාර්ග ගත	කෘෂිකාර්මික කාර්මික සංවර්ධනය පිළිබඳ දැනුම
120. තිරසාර කෘෂිකාර්මික යාන්ත්‍රිකකරණය සඳහා වන මධ්‍යස්ථානයේ පාලක මණ්ඩලයේ 18 වැනි සැසිවාරය	01	09.12.2022			මාර්ග ගත	තිරසාර කෘෂිකාර්මික යාන්ත්‍රිකකරණය පිළිබඳ දැනුම හුවමාරු කර ගැනීම
121. සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා පාරිසරික කෘෂිකාර්මික වටිනාකම් දාමයන් වැඩිදියුණු කිරීම පිළිබඳ සම්මන්ත්‍රණය	01	01.11.2022 10.11.2022			මාර්ග ගත	පාරිසරික කෘෂිකාර්මික වටිනාකම් දාමයන් වැඩිදියුණු කිරීම පිළිබඳ දැනුම
122. සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා පලතුරු සහ එළවළු පසු අස්වනු හැසිරවීම සහ බෙදා හැරීම් සම්බන්ධයෙන් නැගී එන තාක්ෂණය පිළිබඳ සම්මන්ත්‍රණය	01	04.11.2022 24.11.2022			මාර්ග ගත	පලතුරු සහ එළවළු පසු අස්වනු හැසිරවීම සහ බෙදා හැරීම් පිළිබඳ නැගී එන තාක්ෂණය පිළිබඳ දැනුම
123. සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා කෘෂිකාර්මික ජෛව තාක්ෂණය යොදා ගැනීම පිළිබඳ සම්මන්ත්‍රණය	03	07.11.2022 06.12.2022			මාර්ග ගත	කෘෂිකාර්මික ජෛව තාක්ෂණය යොදා ගැනීම පිළිබඳ දැනුම
124. සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා දේශගුණික වෙනස්කම් සහ කෘෂිකාර්මික තිරසාර සංවර්ධනය පිළිබඳ සම්මන්ත්‍රණය	01	16.11.2022 06.12.2022			මාර්ග ගත	සඳහා දේශගුණික වෙනස්කම් සහ කෘෂිකාර්මික තිරසාර සංවර්ධනය පිළිබඳ දැනුම

වැඩසටහනේ නම	පුහුණු කළ සංඛ්‍යාව	වැඩසටහනේ කාලය	මුළු ආයෝජනය (රු.'000)		වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය)	නිමවුම/ ලබා ගත් දැනුම
			දේශීය	විදේශීය		
125. සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා අපනයනය කළ හැකි කෘෂිකාර්මික නිෂ්පාදනවල ආරක්ෂාව සහ තත්ත්ව කළමනාකරණය පිළිබඳ සම්මන්ත්‍රණය	01	10.11.2022 23.11.2022			මාර්ග ගත	අපනයනය කළ හැකි කෘෂිකාර්මික නිෂ්පාදනවල ආරක්ෂාව සහ තත්ත්ව කළමනාකරණය පිළිබඳ දැනුම
දේශීය පශ්චාත්උපාධි වැඩසටහන්						
126. ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය	01	.2022.03 05සිට .2023.03 04	122.50	-	දේශීය	ආර්ථික විද්‍යාව පිළිබඳ දැනුම
වෙනත් දේශීය පුහුණු						
127.විනය කාර්ය පටිපාටිය පිළිබඳ පුහුණු වැඩසටහන	60	2022.02. 24/25	47.30		දේශීය	විනයානුකූලව කටයුතු කරන සේවක පිරිසක් බිහිකිරීම
128. උද්‍යාන අලංකරණය පිළිබඳ පුහුණු වැඩසටහන - පේරාදෙණිය උද්භිද උද්‍යානය	09	2022.03. 08/10/11/ 14/15			දේශීය	උද්‍යාන අලංකරණය පිළිබඳ කම්කරු කාර්ය මණ්ඩලයේ දැනුම වර්ධනය කිරීම
129.ඵලදායිතා සංකල්ප පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව -ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය	06	2022.03. 21/22/23/ 25/31	48.00		දේශීය	නිලධාරීන්ගේ ඵලදායිතාව පිළිබඳ දැනුම වර්ධනය කිරීම
130.සන්නිවේදන නිපුණතා ප්‍රවර්ධන පුහුණු වැඩසටහන (කණිෂ්ඨ කාර්ය මණ්ඩලය සඳහා)	52	2022.03. 28/29	80.50		දේශීය	විශිෂ්ඨ සංනිවේදන කුසලතාවලින් යුත් සේවක පිරියක් බිහි කිරීම

වැඩසටහනේ නම	පුහුණු කළ සංඛ්‍යාව	වැඩසටහනේ කාලය	මුළු ආයෝජනය (රු.'000)		වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය)	නිමවුම/ ලබා ගත් දැනුම
			දේශීය	විදේශීය		
131. කාර්යාලයක භාවිතාවන මූලික පොත්පත් හා ලේඛන/ ලිපි ලිවීම හා සටහන් ලිවීම/ ලිපි ගොනුකරණය පිළිබඳ පුහුණු වැඩසටහන (ආයතන 03 ශාඛාව	09	2022.08.03			දේශීය	නිවැරදිව රාජකාරි ඉටු කිරීම සඳහා දැනුමින් පරිපූර්ණ වූ නිලධාරීන් බිහි කිරීම
132. කම්කරු කාර්ය මණ්ඩලයේ සුදුසුකම් සම්පූර්ණ කිරීමේ පුහුණු වැඩසටහන - අගුණකොළපැලැස්ස	47	2022.09. 26/27/28/ 29/30, 2022.10. 01/02	343.60		දේශීය	සේවය ස්ථිර කිරීමට අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කිරීම
133. රියදුරු කාර්ය මණ්ඩලයේ වෘත්තීය නිපුනතා ප්‍රවර්ධන පුහුණු වැඩසටහන	56	2022.12. 05/06	369.10		දේශීය	සුරක්ෂිත ගමනාන්තයක් සඳහා රියදුරු කාර්ය මණ්ඩලය යොමු කිරීම
134. සංචාරක බංගලා භාරකරුවන්, ස්ටුවර්ඩ් හා අරක්කැමියන් සඳහා වන පුහුණු වැඩසටහන	24	2022.11. 28/29	127.97		දේශීය	පිළිගැන්වීම, සත්කාර සේවාවන් සපයන්නේ කෙසේද යන්න පිළිබඳව එම කාර්ය මණ්ඩලය දැනුවත් කිරීම
135. පරිගණක දැනුම වැඩි කිරීමේ පුහුණු වැඩසටහන (I කාණ්ඩය)	18	2022.11. 30			දේශීය	නිලධාරීන්ගේ පරිගණක දැනුම වර්ධනය කිරීම
136. පරිගණක දැනුම වැඩි කිරීමේ පුහුණු වැඩසටහන (II කාණ්ඩය)	09	2022.12. 02			දේශීය	නිලධාරීන්ගේ පරිගණක දැනුම වර්ධනය කිරීම
137. පරිගණක දැනුම වැඩි කිරීමේ පුහුණු වැඩසටහන (III කාණ්ඩය)	09	2022.11. 13			දේශීය	නිලධාරීන්ගේ පරිගණක දැනුම වර්ධනය කිරීම

වැඩසටහනේ නම	පුහුණු කළ සංඛ්‍යාව	වැඩසටහනේ කාලය	මුළු ආයෝජනය (රු.'000)		වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය)	නිමවුම/ ලබා ගත් දැනුම
			දේශීය	විදේශීය		
වෙනත් දේශීය පුහුණු (මාර්ගගත)						
138. කාර්යාල ක්‍රමවේද හා ආචාර ධර්ම පිළිබඳ පුහුණු වැඩමුළුව - SDFL ආයතනය	09	2022.05. 09/18	67.50		දේශීය	රාජකාරී නිවැරදිව හා විධිමත්ව ඉටු කිරීම සඳහා වූ දැනුම ලබා දීම
139. සංවර්ධන නිලධාරීන් සඳහා සේවාරම්භක පුහුණුව (දමිළ මාධ්‍ය) රාජකාරී නිවැරදිව හා විධිමත්ව ඉටු කිරීම සඳහා වූ දැනුම ලබා දීම	24	2022.04.26/27			දේශීය	රාජ්‍ය සේවය සම්බන්ධයෙන් දැනුම හා අවබෝධය සහිත නිලධාරීන් බිහිකිරීම
140. සංවර්ධන නිලධාරීන් සඳහා සේවාරම්භක පුහුණුව (සිංහල මාධ්‍ය)	140	2022.04. 26/27			දේශීය	රාජ්‍ය සේවය සම්බන්ධයෙන් දැනුම හා අවබෝධය සහිත නිලධාරීන් බිහිකිරීම
141. ප්‍රසම්පාදනය පිළිබඳ පුහුණු වැඩසටහන (සිංහල මාධ්‍ය)	143	2022.05. 18			දේශීය	විනිවිද භාවයකින් යුතුව ප්‍රසම්පාදන කටයුතු කඩිනමින් සිදු කිරීම
142. ප්‍රසම්පාදනය පිළිබඳ පුහුණු වැඩසටහන (දමිළ මාධ්‍ය)	10	2022.05. 19			දේශීය	විනිවිද භාවයකින් යුතුව ප්‍රසම්පාදන කටයුතු කඩිනමින් සිදු කිරීම
143. කාර්යාල කළමනාකරණය පිළිබඳ පුහුණු වැඩසටහන (සිංහල මාධ්‍ය)	103	2022.06. 06/07			දේශීය	සරල, කාර්යක්ෂම හා ගුණාත්මක වැඩ පරිසරයක් ඇති කිරීම
144. පෞද්ගලික ලිපි ගොනුකරණය පිළිබඳ පුහුණු වැඩසටහන (සිංහල මාධ්‍ය)	103	2022.09. 01/02			දේශීය	පෞද්ගලික ලිපි ගොනුකරණය සම්බන්ධයෙන් වූ දැනුම වර්ධනය කරමින් නිවැරදිව පෞද්ගලික ලිපිගොනු පවත්වාගෙන යාම
වැඩසටහනේ නම	**පුහුණු කළ සංඛ්‍යාව**	**වැඩසටහනේ කාලය**	**මුළු ආයෝජනය (රු.'000)**		**වැඩසටහනේ**	**නිමවුම/ ලබා ගත් දැනුම**

			දේශීය	විදේශීය	ස්වභාවය (දේශීය/ විදේශීය)	
145. පෞද්ගලික ලිපි ගොනුකරණය පිළිබඳ පුහුණු වැඩසටහන (දමිළ මාධ්‍ය)	40	2022.12. 05/06/08/ 09 (දිනකට වරුව බැගින්)	12.00		දේශීය	පෞද්ගලික ලිපි ගොනුකරණය සම්බන්ධයෙන් වූ දැනුම වර්ධනය කරමින් නිවැරදිව පෞද්ගලික ලිපිගොනු පවත්වාගෙන යාම
146. විශ්‍රාම වැටුප් කටයුතු පිළිබඳ පුහුණු වැඩසටහන (සිංහල මාධ්‍ය)	107	2022.09. 20			දේශීය	විශ්‍රාම වැටුප් පිළිබඳ නිලධාරීන්ට පවත්නා ගැටළු නිරාකරණය කර ගැනීම
147. ඉදිකිරීම් කර්මාන්තයේ රක්ෂණ, බැදුම්කර සහ ඇපකර පිළිබඳ පාඨමාලාව - IESL ආයතනය	01	2022.09. 14 සිට බදාදා දින 06 ක්	14.30		දේශීය	රක්ෂණ, බැදුම්කර සහ ඇපකර පිළිබඳව ඉංජිනේරුවකු සතුවිය යුතු ලබා ගත යුතු දැනුම හා අවබෝධය දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු අංශය වෙත ලබා දීම
148. ප්‍රසම්පාදන කටයුතු පිළිබඳ පුහුණුව (ප්‍රසම්පාදන කමිටු සාමාජිකත්වය දරන මාණ්ඩලික නිලධාරීන්) - SLIDA	71	2022.11. 03/04/10/ 11/25	122.25		දේශීය	විනිවිද භාවයකින් යුතුව ප්‍රසම්පාදන කටයුතු කඩිනමින් සිදු කිරීම පිළිබඳ ප්‍රසම්පාදන කමිටු නිලධාරීන් දැනුවත් කිරීම
149. විශ්‍රාම වැටුප් කටයුතු පිළිබඳ පුහුනු වැඩසටහන (දමිළ මාධ්‍ය)	60	2022.11. 28/29 (දිනකට වරුව බැගින්)	6.00		දේශීය	විශ්‍රාම වැටුප් පිළිබඳ නිලධාරීන්ට පවත්නා ගැටළු නිරාකරණය කර ගැනීම
150. විනය කාර්ය පටිපාටිය පිළිබඳ පුහුනු වැඩසටහන (දමිළ මාධ්‍ය)	54	2022.12. 06/08/15/ 16 (දිනකට වරුව බැගින්)	9.60		දේශීය	විනයානුකූලව කටයුතු කරන සේවක පිරිසක් බිහිවීම

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. CPCG/KD/E/2/23/A/29

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2023 මැයි 23 දින

ගණන්දීමේ නිලධාරී
කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

ශීර්ෂය 285 - කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 **තත්ත්වාගණනය කළ මතය**

ශීර්ෂය 285 - කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 මැයි 15 දින නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022දෙසැම්බර් 31 දිනට කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේමූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්

ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූපී වේ.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 අත්තිකාරම් ගෙවීම්

මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයට අනුව (ACA-F) සමාලෝචිත වර්ෂයේ අත්තිකාරම් ලැබීම් හා අත්තිකාරම් ගෙවීම් පිළිවෙලින් රු. 1,348,571,573 ක් හා රු. 1,294,318,401 ක් ලෙස දක්වා තිබුණද භාණ්ඩාගාර සටහන් අනුව අත්තිකාරම් ලැබීම් හා ගෙවීම් පිළිවෙලින් රු.1,349,780,930 ක් හා රු. 1,294,573,401 ක් වූ බැවින් අත්තිකාරම් ලැබීම් රු.1,209,357 කින් හා අත්තිකාරම් ගෙවීම් රු. 255,000 කින් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

1.6.2 මූල්‍ය නොවන වත්කම්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මූල්‍ය ප්‍රකාශන (ඒසිඒ - 6) අනුව මූල්‍ය නොවන වත්කම් යටතේ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හඳුනාගෙන තිබූ වාහනවල වටිනාකම රු.1,600,904,975 ක් වුවද, දෙපාර්තමේන්තුව මගින් ඉදිරිපත් කළ ලේඛනවලට අනුව එය රු.1,605,524,742 ක් වූයෙන් රු.4,619,766 ක වෙනසක් පැවතුණි.

(ආ) මූල්‍ය ප්‍රකාශන (ඒසිඒ - 6) අනුව මූල්‍ය නොවන වත්කම්වල සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගොඩනැගිලි සහ ඉදිකිරීම් රු. 7,119,325,465 ක් වුවද, භෞතිකව තහවුරු කරගෙන තිබුණු වටිනාකම අනුව එය රු. 1,809,182,290 ක් විය. ඒ අනුව එකතුව රු. 5,310,143,175 ක වෙනසක් නිරීක්ෂණය විය. තවද ගොඩනැගිලි සහ ඉදිකිරීම් අවස්ථා 1248 ක් තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) මූල්‍ය ප්‍රකාශන (ඒසිඒ - 6) අනුව මූල්‍ය නොවන වත්කම්වල සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉඩම්වල වටිනාකම රු. 17,849,002,464 ක් වුවද, භෞතිකව තහවුරු කරගෙන තිබුණු වටිනාකම අනුව එය රු. 11,664,574,116 ක් විය. ඒ අනුව එකතුව රු. 6,184,428,348 ක වෙනසක් නිරීක්ෂණය විය. තවද දෙපාර්තමේන්තුවට අයත් ඉඩම් 372 ක් තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

1.6.3 වාණිජ අත්තිකාරම් ගිණුම්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පැල්වෙහෙර නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලයේසමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති රු. 791,608 ක ණයගැති ශේෂය රු. 79,168 ක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් ණයගැති ශේෂය රු. 712,440 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) බටඅත නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලයට, හම්බන්තොට නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලයෙන් අය විය යුතු රු. 150,000 ක ණයගැති ශේෂය මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) තෙලිජ්ජවිල නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලයේ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති ණයගැති ශේෂය තුල කොන්ත්‍රාත් බීජ වැඩ සටහනට (201 ගිණුමට) අයත් රු.128,116 ක ණයගැති ශේෂයක් ඇතුළත්ව තිබුණි.

(ඈ) මිපිළිමාන බීජ අර්තාපල් නිෂ්පාදන ගොවිපලට අයත් මෝටර් රථ 05 ක වටිනාකම තක්සේරු කර ක්ෂය ගණනය කර ගිණුම්ගත කර නොතිබුණි.

(ඉ) පොළොන්නරුව බීජ නිෂ්පාදන ගොවිපලේ සමාලෝචිත වර්ෂය තුළ අපහරණය කර තිබුණු යන්ත්‍රවලට අදාළ සමුච්චිත ක්ෂය වටිනාකම රු. 4,638,657 ක් වුවත්, එය රු. 3,478,042 ක් ලෙස රු.1,160,615 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඊ) උඩරැදැල්ල බීජ නිෂ්පාදන ගොවිපලේ සමාලෝචිත වර්ෂය අවසානයේ තොග තක්සේරු වාර්තාව අනුව අනෙකුත් පාරිභෝගික ද්‍රව්‍ය තොගයේ වටිනාකම රු. 968,093 ක් වුවත්, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ රු. 1,816,959 ක් ලෙස දැක්වීම හේතුවෙන් අනෙකුත් පාරිභෝගික ද්‍රව්‍ය තොගය රු. 848,866 කින් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි.

(උ) කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සංවර්ධන ගිණුම යටතේ හඳුනාගෙන තිබුණු රු. 57,500,314 ක යන්ත්‍ර හා උපකරණ තොගයක් සමාලෝචිත වර්ෂය තුල ගොවිපල් අත්තිකාරම් ගිණුමට මාරු කර තක්සේරු කිරීමකින් තොරව පිරිවැය මත රු. 1,437,507 ක ශේෂයක් ගොවිපල් අත්තිකාරම් ගිණුමේ වර්ෂයේ ක්ෂය වශයෙන් ගිණුම් ගත කර තිබුණි.

(ඒ) සමාලෝචිත වර්ෂය තුල අපහරණය කරන ලද ස්ථාවර වත්කම් වලට අයත් රු. 24,364,021 ක සමුච්චිත ක්ෂය, ක්ෂය සංචිත අරමුදල ගිණුම හර කර සමුච්චිත අරමුදල් ගිණුමට බැර කළ යුතු වුවද, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

1.6.4 **ගනුදෙනු බේරා අවසන් කිරීමේ අත්තිකාරම් ගිණුම**

මුදල් රෙගුලාසි 518(3) ප්‍රකාරව අත්තිකාරම් කාර්යය වසා දැමීමෙන් පසු එළඹෙන වර්ෂයේදී ඇවර කිරීමේ කටයුතු නිම කළ යුතු වුවද කෘෂිකර්ම දෙපාර්තමේන්තුව යටතේ පැවති වාණිජ අත්තිකාරම් කටයුතු 05 ක් 1991 සිට 2002 දක්වා කාලය තුල අමාත්‍ය මණ්ඩල තීරණයක් මත වසා දැමීමට තීරණය කරතිබුණි. එසේ වාණිජ අත්තිකාරම් ගිණුම වසා දමා වර්ෂ 20 ත් 31 ත් අතර කාලයක් ගත වී ඇතත්, ඇවර කිරීමේ කටයුතු නිම කර ගිණුම් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 බැරකම් හා බැදීම්වලට එළඹීම

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2017 අප්‍රේල් 27 දිනැති අංක 255/ 2017 දරන රාජ්‍ය ගිණුම් වක්‍රලේඛයේ 03 ඡේදයට අනුකූල නොවන පරිදි වැය විෂයයන් 02 ක ප්‍රතිපාදන ඉක්මවා රු. 871,828 ක බැරකම් වලට එළඹ තිබුණි.

(ආ) මූල්‍ය ප්‍රකාශන බැඳීම් හා බැරකම් පිළිබඳ සටහන (iv) අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට බැඳීම් හා බැරකම් ශේෂය රු. 7,251,091 ක් බව දක්වා තිබුණද භාණ්ඩාගාර මුද්‍රිත SA 92 ලේඛනය අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ශේෂය රු. 15,098,673 ක් විය.

2.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

රාජ්‍ය සේවා කොමිසම් සභා කාර්යය පරිපාටික රීති 1 කාණ්ඩයේ XVIII වන පරිච්ඡේදයේ 193 වන ඡේදයට පරිබාහිරින් කටයුතු කර දෙපාර්තමේන්තුවේ ඒකක7 කට අනුයුක්ත නිලධාරීන් 183 දෙනෙකු වසර 5 කට වැඩි කාලයක් එකම ආයතනයක සේවය කරමින් පැවැතුණි.

2.3 අවධිමත් ගනුදෙනු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මු.රෙ. 753(2) ප්‍රකාරව කටයුතු නොකර ගන්නෝරුව උද්‍යාන භෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය රු. 1,900,734 ක රසායනාගාර මේස මිලදී ගැනීමේදී භාණ්ඩ ලැබී නොතිබියදී, ගබඩා භාර නිලධාරියා විසින් භාණ්ඩ ලැබුණු බවට ව්‍යාජ ලෙස දක්වා පොදු 219 නිකුත් කර තිබුණි. 2023 මාර්තු 15 දින වන විටත් අදාළ භාණ්ඩ ලැබී නොතිබුණු අතර ඒ වෙනුවෙන් 2022 දෙසැම්බර් 31 දිනැතිව ලියන ලද රු.1,900,734 ක චෙක්පතක් දින 75 ක කාලයක් ව්‍යාප්ති ගිණුම් අංශයෙහි රඳවාගෙන තිබුණි.

(ආ) රජයේ බීජ අර්තාපල් නිෂ්පාදන ගොවිපල් 03 ක් සඳහා මිලදී ගැනීමට සැලසුම් කර තිබුණු Front end Loaders 03 ක් සඳහා අවස්ථා 03 කදී එකතුව රු. 9,449,925 ක් ගෙවා තිබුණි. ඊට අදාළ චෙක්පත් 2023 පෙබරවාරි 28 දින වන විට නිෂ්කාශනය වී ඇතත් ව්‍යාජ පොදු 219 සහතික මත ගෙවීම් කර තිබුණු අදාළ උපකරණ 2023 මාර්තු 30 දින වන විටත් ගොවිපල් වෙත ලැබී නොතිබුණි.

2.4 ගණන් දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතික වීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන් දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායී ලෙස කරගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයක් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

2.5 බැංකු ගිණුම් මෙහෙයවීම

දෙපාර්තමේන්තුවේ බැංකු ගිණුමකට අදාලව සමාලෝචිත වර්ෂයේ අගෝස්තු සිට දෙසැම්බර් දක්වා කාලය තුල ව්‍යාපෘති කාර්යයන් වෙනුවෙන් ලියන ලද රු. 10,309,346 ක චෙක්පත් 26 ක් අදාළ ආදායකයා වෙත නිකුත් නොකර පරීක්ෂා කළ දිනය වූ 2023 මාර්තු 15 දින වන විටත් ගිණුම් අංශය තුල රඳවා ගෙන තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 දැක්ම හා මෙහෙවර

බීජ නිෂ්පාදන ගොවිපලෙහි ප්‍රධාන අරමුණ ගුණාත්මක බීජ නිෂ්පාදනය වුවද, ප්‍රරෝහණ ප්‍රතිශතය සියයට 50 – 75 දක්වා වූ බීජ අනුමත මිලෙන් සියයට 50 ක් අඩුකර හා ප්‍රරෝහණ ප්‍රතිශතය සියයට 25 - 50 අතර පවතින බීජ අනුමත මිලෙන් සියයට 75 ක් අඩුකර ගොවීන්ට නිකුත් කර තිබුණි.

3.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කුණ්ඩසාලේ රජයේ බීජ නිෂ්පාදන ගොවිපලට අවශ්‍ය බීජ නියමිත කාල සීමාව තුළ ලබා ගැනීමට කටයුතු නොකිරීමෙන් කන්න 04 ක අවස්ථා 16 කදී බෝග වර්ග 07 කට අදාළව අපේක්ෂිත බීජ කි.ග්‍රෑ 4810 කනිෂ්පාදනයක් සිදුකිරීමට නොහැකි වී තිබුණි.

(ආ) මහඉලුප්පල්ලම බීජ නිෂ්පාදන ගොවිපලේ 2019 වර්ෂයේ යල කන්නයේ සිට 2022 යල කන්නය දක්වා වූ කන්න 07 ක අපේක්ෂිත මුළු වී බීජ නිෂ්පාදනය කි.ග්‍රෑ.3,067,620ක් වුවත්,එම කාලය තුල රු. 86,001,891ක්,වැය කරවී බීජ කි.ග්‍රෑ.1,400,265 ක් හෙවත් අපේක්ෂිත නිෂ්පාදනයේ සියයට 46 ක් පමණක් නිෂ්පාදනය කර තිබුණි. එමෙන්ම එම කාල පරිච්ඡේදය තුල අපේක්ෂිත මුළු අතිරේක ආහාර බෝග බීජ නිෂ්පාදනය කි.ග්‍රෑ.51,040 ක් වුවත් රු. 23,875,563ක පිරිවැයක් දරා අතිරේක ආහාර බෝග බීජ කි.ග්‍රෑ.10,823ක් හෙවත් අපේක්ෂිත නිෂ්පාදනයෙන් සියයට 21ක් පමණක් නිෂ්පාදනය කර තිබුණි.

3.3 වාර්ෂික කාර්යසාධන වාර්තාව

2020 අගෝස්තු 28 දිනැති අංක 2/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.2 ඡේදය ප්‍රකාරව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ මාර්ගෝපදේශ අංක 14 හි සඳහන් ආකෘතිය ප්‍රකාරව වාර්ෂික කෙටුම්පත් කාර්යසාධන වාර්තාවක් මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කර නොතිබුණි.

3.4 වත්කම් කළමනාකරණය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 1947 අංක 08 දරන රජයේ ඉඩම් ආඥා පනතේ 224 වගන්තිය ප්‍රකාරව කටයුතු කර කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අයත් ආයතන 10 කට අදාළ හෙක්ටයාර් 2191 ක භූමි ප්‍රමාණයක් විධිමත්ව පවරාගෙන නොතිබුණි.

(ආ) කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අයත් ආයතන 10ක පවතින එකතුව රු. 116,976,640 ක යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ 261 ක් වසර 01 ත් 07 ත් දක්වා කාල පරාසයක සිට භාවිතයට නොගෙන නිශ්ක්‍රීය හා ඌන උපයෝජිතව පැවතුණි.

(ඇ) කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වෙත විවිධ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා ව්‍යාපෘති මගින් ලැබී තිබුණු ආයතන 09 ක පවතින යතුරු පැදි 23 ක් හා ඒකක 46 කට අදාළ අත් ට්‍රැක්ටර් හා ට්‍රැක්ටර් 105 ක් 2022 නොවැම්බර් 30 දින වන විටත් කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්ගේ නමින් ලියාපදිංචි කර නොතිබුණි.

(ඈ) දෙපාර්තමේන්තුවේ වාහන 72 ක් හා යතුරු පැදි 183 ක් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ සඳහා ආදායම් බලපත්‍ර ලබාගෙන නොතිබුණි.

(ඉ) දෙපාර්තමේන්තුවේ ඒකක 11 කට අයත් අත් ට්‍රැක්ටර්, ට්‍රැක්ටර් හා කොළ මඩින යන්ත්‍ර 40 ක් අපහරණය සඳහා යොමු කර ඇතත් 2022 වර්ෂය වන විටද ඒවායේ අපහරණයන් සිදුකර නොතිබුණි.

(ඊ) දෙපාර්තමේන්තුවේ එකක 72 කට අදාළව රජයේ නිවාස 396 ක් භාවිතයට ගැනීමකින් තොරව නිෂ්කාර්යයව පැවතුණි.

(උ) සේනා දළඹු ව්‍යාප්තිය අධ්‍යයනය හා ඒ පිළිබඳ සොයා බැලීම සඳහා කෘෂිකාර්මික යාන්ත්‍රිකරන පර්යේෂණ මධ්‍යස්ථානය වෙත රු. 6,395,847 ක් ගෙවා 2019 දෙසැම්බර් 20 දින ඩ්‍රෝන කැමරා පද්ධතියක් මිලදී ගෙන තිබුණි. නමුත් මෙම කැමරා පද්ධතියෙන් අපේක්ෂිත කාර්යය ඉටු කර ගැනීම සඳහා ඩ්‍රෝන් මෘදුකාංගය ස්ථාපිත කිරීම වෙනුවෙන් අවශ්‍ය ඩෙස්ටිනොප් පරිගණකයක් මිලදී ගැනීමට නොහැකි වීම හේතුවෙන් මෙම කැමරාව වසර 03 කට අධික කාලයක් නිෂ්කාර්යවපැවතුණි.

3.5 පාඩු හා හානි

මූල්‍ය ප්‍රකාශනවල පාඩු හා අත් හැරීම් පිළිබඳ ප්‍රකාශයේ දක්වා තිබුණු මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව පරීක්ෂණ කටයුතු අවසන් නොකළ 1976 වර්ෂයේ සිට පවතින රු.104,443,743 ක හානි හා පාඩු සිද්ධි 383 ක් සම්බන්ධව අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

3.6 කළමනාකරණ දුර්වලතා

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 1981 නොවැම්බර් 02 දිනැති අංක 165/2 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ 6 වන ඡේදය ප්‍රකාරව කොළඹ, කටුනායක, ත්‍රිකුණාමලය, තලෙයිමන්නාරම, ගාලු හා කන්කසන්තුරේ වරායන්හි ශාක නිරෝධායන සේවයේ ඒකකයක් ස්ථාපිත කර නොතිබුණි.

(ආ) කුණ්ඩසාලේ රජයේ බීජ නිෂ්පාදන ගොවිපලට අයත් අංක 6656 දරන පිඹුර මඟින් වෙන්කර තිබුණු අක්කර 1.5 කට අයත් ඉඩම් කොටස් 21 ක් අනවසර පදිංචි කරුවන්හාවිතා කර ඇති අතර එයින් කොටස් 2 ක ස්ථිර ඉදිකිරීම් සිදුකර තිබුණි.

(ඇ) කුණ්ඩසාලේ රජයේ බීජ නිෂ්පාදන ගොවිපලේ කුඩා පරිමාණ වැව් 11 ක රොන්මඩ ඉවත් කිරීමේ අවශ්‍යතාවය2019 වර්ෂයේ සිට හඳුනාගෙන වසර 04 ක කාලයක් ගත වී ඇතත්, මෙම වැව්වල රොන්මඩ ඉවත් කිරීමේ කටයුතු සිදු කර නොතිබුණි.

(ඈ) කුණ්ඩසාලේ බීජ නිෂ්පාදන ගොවිපලට එළවළු වගාවේ පේලි අතර වල් මර්ධනය සඳහාKubota RK -80 වර්ගයේ රෝද දෙකේ ට්‍රැක්ටර් රථවල අවශ්‍යතාවය පැවැතුණද අවශ්‍යතාවය නිවැරදිව හඳුනා නොගෙන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් Brown Yanmarවර්ගයේ ද්වී රෝද ට්‍රැක්ටර් දෙකක් ලබාදී තිබුණි. ඒ අනුව එළවළු වගාවේ පේලි අතර වල් මර්ධනය සඳහා මෙම යන්ත්‍රසුදුසු නොවන බව සඳහන් කර පසුව එම ට්‍රැක්ටර් රථ දෙක තෙලිජ්ජවිල හා බටඅත ගොවිපලවල් වෙත ලබා දීමට කටයුතු කර තිබුණි.

(ඉ) මහඉලුප්පල්ලම රජයේ බීජ නිෂ්පාදන ගොවිපලේකාබනික පොහොර නිෂ්පාදනය සඳහා ඉකුත් වර්ෂයේ දෙසැම්බර් මස රු. 1,709,800 කට මිලදීගත් වොපර් මැෂින් 03 ක් ලබා දී තිබුණද 2023 ජනවාරි 12 දින වන විටත් මෙම යන්ත්‍ර කාබනික පොහොර නිෂ්පාදනයට යොදාගෙන නොතිබුණි.

(ඊ) මහඉලුප්පල්ලම නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලයට අයත් ගබඩා 06 ක ගබඩා කර තිබුණු බීජ වී කිලෝග්‍රෑම් 273508 ක ප්‍රමාණයකින් බීජ වී කිලෝග්‍රෑම් 239991 ක ප්‍රමාණයක් හෙවත් මුළු බීජ වී ප්‍රමාණයෙන් සියයට 88 ක් අසම්මත් බීජ බව බීජ සහතික කිරීමේ සේවය සහතික කර තිබුණි.

(උ) දෙපර්තමේන්තුවේ ඒකක 54 කට අනුයුක්ත කර තිබුණු අත් ට්‍රැක්ටර්, ට්‍රැක්ටර් හා කොළ මඩින යන්ත්‍ර 139 ක් හා ඒකක 32 කට අනුයුක්ත කර තිබුණු යතුරු පැදි 84 ක වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.

4. **මානව සම්පත් කළමනාකරණය**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධාරීන් 1050 ක් අතුළුව අනුමත සේවක සංඛ්‍යාව 12374 ක් වූ අතර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිළධාරීන් 658 ක් ඇතුලුව මුළු පුරප්පාඩු සංඛ්‍යාව 2726 ක් විය.

(ආ) කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ විශ්‍රාමිකයින් 303 ක ගේ විශ්‍රාම වැටුප් ලිපිගොනු වැඩ අවසන් නොවීම මත විශ්‍රාම වැටුප් ගෙවීමට නොහැකි වී තිබුණි.

එච්.ඒ. ආනන්ද
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට.